**බළන්ගොඩ නගර සභාව**

**2021-03-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.03.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7 ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය විශේෂ මහ සභා වාර්තාව, මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-02-02 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව, 2021-02-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් 2021-02-02 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව, 2021-02-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවල සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් 2021-02-09 දින පැවති මහ සභා වාර්තාවේ සංදේශ/පැමිණිලි/පෙත්සම් ඉදිරිපත් කිරීම යටතේ පදික වෙළෙඳාම සම්බන්ධව සාකච්ඡා කළ අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ අදහස් දැක්වීමේදී (පිටු අංක 03) තමන් එය ස්ථිර කර ඇති බවට සටහන්ව ඇති අතර එය ඉවත් කළ යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව ඉහත සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ලෙස ආරම්භක අවස්ථාවේ සිටම විශාල දුෂ්කරතා අභියෝගයන්, තාඩන පීඩන මධ්‍යයේ මෙම සභාව කරගෙන ආ අතර, එහිදී හිටපු සභාපතිවරුන් හා නිළධාරීන් කරගෙන ආ පරිදි සියලුම පළාත් පාලන ආයතන තරඟ අතරින් බළන්ගොඩ නගර සභාව ඉදිරියෙන් සිටි බවද කාර්ය සාධන තරඟ, පළාත් පාලන ආයතන අතරින් ලංකාවේ ප්‍රථම ස්ථානය හොඳම මූල්‍ය වාර්තාව හා වාර්ෂික වාර්තාවට ලබා ගනිමින් ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් සුවිශේෂී පලාත් පාලන අයතනයක් ලෙස දුක් මහන්සි වෙමින් සභාවේ කටයුතු කරගෙන ආ බව ද පසුගිය නොවැම්බර් දෙසැම්බර් හා ජනවාරි මාස වල දැඩි අපහසුතාවයන්ට, කඩාවැටීම් වලට ලක්වූ බවද පවසන ලදී. එමෙන්ම දුෂ්කර අවස්ථාවලදී අභියෝගවලින් නොසැලී සිට අභියෝග ජයගෙන සත්‍යය සාධාරණය මහපොළොවේ යථාර්ථයක් කිරිමට නිරතුරුව තමන් දිරිමත් කරමින් ශක්තියක් වූ රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාට, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මැතිතුමාට, පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ මැතිතුමා හා එක්සත් ජාතික පක්ෂයේ

නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙන්ම හිතවත් ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාට ද තමන්ට අවශ්‍ය නීතිඥ සහය ලබා දුන් ෆයිසර් මුස්තාපා මැතිතුමාට හා තම හිතවත් රෝහිත අබේගුණවර්ධන මැතිතුමාට ද තම නායිකාව වන තලතා අතුකෝරාල මැතිතුමියට ද තම හිතවත් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාට ද වජිර අබේගුණවර්ධන මැතිතුමාට මෙන්ම තමා සමඟ බළන්ගොඩ දේශපාලනයේ ළඟින්ම සිටි සුසන්ත පුංචිනිලමේ මැතිතුමාට ද මෙම අවස්ථාවේදී තම ගෞරව පූර්වක ස්තුතිය පළ කරන බවද ගෞරවයෙන් සිහිපත් කරන බව ද එම සියලු දෙනාට මෙන්ම මෙම අභියෝග සියල්ල ලබාදුන් සියලු දෙනාටමත් තම ස්තුතිය පුද කරන බව පවසන ලදී.

2021 වර්ෂයේ මේ වන විට බළන්ගොඩ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් නගර සභාවේ මුදල් ප්‍රතිපාදන වලින් ආරම්භ කර තිබිය යුතු අතර, 2021 වර්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් සඳහා රුපියල් ලක්ෂ පහක මුදලක් වෙන් කළ බවද එක් කොට්ඨාශයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක මුදලක් වෙන් කර ඇති අතර, ඊට අමතරව එක් කොට්ඨාශයකට රුපියල් ලක්ෂ විසි පහක මුදලක් වෙන් කිරීමට සැලසුම් කළ නමුත් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ලක්ෂ 250 ක් 300 කට වැඩි සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වී ඇති බවද එයට හේතුව පසුගිය කාලයේ මෙම සභාවේ ඇති වූ විවිධ ප්‍රශ්න බවද පවසන ලදී. දේශපාලනයේ සදාකාලික හතුරෝ මෙන්ම මිතුරෝද නැත යනුවෙන් පැවසූ ගරු සභාපතිතුමා තමන්ගේ නිර්දෝශීභාවය පිළිබඳ අදහස් දැක්වීම හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාට තමන් ස්තුතිවන්ත වන බවද තමා නරක මනුස්සයෙක් නොවන අතර මෙය දේශපාලන ප්‍රශ්නයක් බව එතුමා එහි දී පවසා ඇති බවද තමන් කිසිම කෙනෙකු සමඟ හිතේ කහටක් තරහක් නොමැති නමුත් සභාවට ප්‍රාග්ධන වියදම් දැරීමට නොහැකි අතර පුනරාවර්ථන වියදම් පමණක් දැරීමට හැකියාවක් පවතින නිසා මෙයින් බළන්ගොඩ ජනතාවට පාඩුවක් ඇති වී තිබෙන බව ද පවසන ලදී.

එමෙන්ම ඉදිරියේදී සභාවේ සභාපති ධූරය සුදුසුකම් ඇති පුද්ගලයෙකුට ලබා දීමට බලාපොරොත්තු වන අතර ඒ අනුව තමන් සභාපති ලෙස සිටින තාක් කල් හා එතුමා මෙම සභාවේ සභාපති ලෙස වැඩ ආරම්භ කළ විටදීත් මෙම සභාව කඩාකප්පල් නොකර අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන ලෙස තමන් ඉල්ලා සිටින බව පවසන ලදී. සමාජයේ ජීවත්වන පුරවැසියන් විසින් සමාජයේ සිටින යහපත් හා සමාජය යහමඟට ගත හැකි හොඳ දැනුමක් බුද්ධියක් හැකියාවක් ඇති මිනිස්සු කොට්ඨාශයක් ලෙස සිතා මහජන නියෝජිතයන් මෙම සභාවට එවන බවත්, එහිදී ගරු සභිකවරුන්ගේ යුතුකම වන්නේ සමාජය යහමඟට ගැනීමත්, බළන්ගොඩ නගර සභාව විසින් රැස්කරන මුදල්, මධ්‍යම රජයෙන් හා පළාත් සභාවෙන් දෙන අරමුදල් මඟින් නාස්තියක් දූෂණයක් වංචාවක් නොමැතිව සංවර්ධනය කළ යුතු ස්ථානවලට එම මුදල් යොමු කිරීම බවත් පවසන ලදී. එමෙන්ම මෙම සභාවේ ඇත්තේ දේශපාලන ප්‍රශ්නයක් බැවින් මෙම සභාව පවතින තාක් මහජනතාවට අවශ්‍ය කරන ප්‍රතිලාභ ලබා දෙමුයි තමන් සියලු දෙනාගෙන් ඉල්ලා සිටින බවද ප්‍රාග්ධන වියදම් දැරීමට අවශ්‍ය අවසරය ලබාගෙන සංවර්ධන වියදම් දැරීමට අවශ්‍ය බලය ලබා ගැනීම සුදුසු බවද මෙම වසර අවසානයේ හෝ ලබන වසර මුල පළාත් පාලන මැතිවරණයක් පවත්වනු ඇති අතර සියලු දෙනා එයට සූදානම් විය යුතු බවද ඒ සඳහා තමන් සභාපති වශයෙන් සිටින තාක්කල් තම සහයෝගය සියලු දෙනාට ලබා දෙන බවද පවසන ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම.**

- මුගුණමලය ඉත්තගලහේන ශෛලතලාරාමයට යන මාර්ගය පටන් ගැන්මේ සිට මීටර් 500 ක පමණ දුරක් කොන්ක්‍රීට් අතුරා ඇති අතර එතැන් පටන් මීටර් 150 ක් පමණ දුරක් සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති බවද පොහොය දිනවල ශෛලතලාරාම විහාරස්ථානයට විශාල ජනකායක් මෙම මාර්ගයේ පැමිණෙන අතර නිවාස 25 ක් පමණ ඇති බවද මෙමඟින් පාසල් ළමුන්ද විශාල අපහසුතාවයට පත්වන බැවින් මෙම මාර්ගය පිළිසකර කර දෙන ලෙස ගම්වාසීන් විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ කාර්මික නිළධාරීතුමා හරහා පරීක්ෂා කර ඉදිරියේදී කර්මාන්ත කමිටුවට යොමු කර අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවයි.

  මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙම නඩත්තු කටයුත්ත ඉක්මනින් ඉටු කර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ගය ගන්නා ලෙස පවසන ලදී.

- නව බස්නැවතුම්පල සී 57 කඩ කාමරයේ බදුකරු වන ඊ. තිලංග ප්‍රනාන්දු යන අය විසින් තම කඩ කාමරයේ වැසි ආවරණයේ කොටසක් කපා දමා එම කඩ කාමරය ඉදිරිපස මාර්ගය ඉදිකිරීම සඳහා සහයෝගය ලබා දුන් බවද එබැවින් තම කඩ කාමරය පිටුපසට කොටසක් ඉදි කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස හා එසේ අවසරය ලබා දුනහොත් තම පුද්ගලික වියදමින් එය ඉදිකර ගන්නාබවද පවසා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙම කඩ කාමරයට කොටසක් එකතු කිරීම සඳහා තම විරෝධය නොමැති අතර, තමන් එම ස්ථානය නිරීක්ෂණයට ගිය අවස්ථාවේ එම පුද්ගලයා මාර්ගය ලබා දීම සඳහා තම කඩ කාමරයන් ලබා දීමට කැමති වූ බව පවසන ලදී. එමෙන්ම මෙම ස්ථානය වැසිකිළියක් බවට පත්ව ඇති බැවින් එයින් මුදවා ගත යුතු අතර, එසේ ලබා දීමට ඉඩ කඩ ප්‍රමාණවත් බවද කවුරු හෝ මන්ත්‍රී වරයෙක් මෙය සඳහා විරුද්ධ වනවානම් විරුද්ධ වීමට හේතු හා මෙම ව්‍යාපෘතිය නිරීක්ෂණය කළාද යනුවෙන් විමසන ලදී.

  ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පෙ.ව.10.23 ට පමණ ගරු සභාව වෙත පැමිණෙන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම කඩ කාමරයට කොටසක් එකතු කිරීමට අවසර ලබා දෙන්නේද නොදෙන්නේද යන්න පිළිබඳ තීරණයක් ගත යුතු බව පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් නාගරික සංවර්ධන අධිකාරිය නගරය සැලසුම් කිරීමේදී අවශ්‍ය උපාංග තීරණය කරන අතර, ඒ අනුව එම ස්ථානය සකස් කර ඇත්තේ ජෙනරේටරයක් ස්ථාපිත කිරීමට සුදුසු වන පරිදි බවද ගරු නාගරික මන්ත්‍රීතුමා පසුගිය සභා වාර කිහිපයේදීම බස්නැවතුම්පලේ ජෙනරේටරයක් ස්ථාපිත කිරීමට සාකච්ඡා කළ අතර මෙම ස්ථානය ව්‍යාපාරික ස්ථානයක් වුවහොත් යම් දිනෙක ජෙනරේටරයක් ස්ථාපිත කරන්නේ කුමන ස්ථානයේද යන්න විමසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් තමන්ද සෑම සභාවාරයකදීම බස්නැවතුම්පල සඳහා ජෙනරේටරයක් ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා කළ අතර මෙම ස්ථානය ජෙනරේටරයක් ස්ථාපිතකිරීම සඳහා යොදවන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් තමන් වැඩ බලන සභාපති ලෙස කටයුතු කරන කාලයේදී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ විශේෂ ඉල්ලීම මත මොවුන් මෙම කඩ කාමරය ඉවත් කර මාර්ගය ලබා දීමට ක්ෂණිකව ක්‍රියාත්මක වූ බවද එම ස්ථානය කිසිවෙකුට යාමට නොහැකි තත්ත්වයේ තිබූ අතර එම කඩ කාමරයේ බදුකරු වහලය ඉවත් කර මාර්ගය සකස් කිරීමට සහයෝගය ලබා දුන් බවද මෙම කඩ කාමරය සඳහා කොටසක් ඉදි කිරීමට අවස්ථාව ලබා දුනහොත් මෙම ස්ථානයේ තව දුරටත් සිදු වන අපචාර ක්‍රියා නැවැත්විය හැකි බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම බදුකරු හොඳ ව්‍යාපාරිකයෙක් බැවින් මෙතුමාට යම් කිසි සහනයක් ලබා දිය හැකි නම් ලබා දීම සුදුසු බව පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ජෙනරේටර් මැෂින් එකක් අවශ්‍ය නම් සභාවට එය ලබා ගන්නා ලෙසද මෙම ස්ථානය ඒ සඳහා වෙන් කරන්නේ නම් මෙම ව්‍යාපාරිකයාට වෙනත් ස්ථානයක් ලබා දෙන ලෙසද මෙතුමාට අසාධාරණයක් වීමට ඉඩ නොතබන ලෙසද මෙම අවස්ථාවේදී අනවශ්‍ය ලෙස ජෙනරේටරයක් ගැන කථා කිරීමෙන් මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා ගැනීමට අවස්ථාව නොලැබෙන බවද පවසන ලදී. එමෙන්ම බස්නැවතුම්පලට ජෙනරේටරයක් අවශ්‍ය නම් එය ලබා ගැනීමට තම සහයෝගය ලබා දෙන බවද වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුවේ අතීතය ගැන කතා කිරීමෙන් අතීතයේම සිටිය යුතු වන බැවින් වර්තමානයේ සිට අවශ්‍ය තීරණ ගත යුතු බවත්, එම නිසා බස්නැවතුම්පලට ජෙනරේටරයක් අනවශ්‍ය නම් එය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සුදුසු බවත්, මෙම ව්‍යාපාරය නගර සභාවේ ලේඛනගත ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන බවත් පවසන ලදී.

අනතුරුව සභාවේ සිදු වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව ලබන සභාවාරයේදී නියමිත පරිදි න්‍යාය පත්‍රය වෙත ඇතුළත් කර තීරණයක් ගැනීම සුදුසු බව තීරණය විය.

- ගරු නගාරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ මවගේ අසනීපය හේතුවෙන් අද දින සභාව සඳහා සහභාගිවීමට නොහැකි බැවින් එතුමාගේ නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී. ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ නිවාඩු අනුමත කරන ලදී.

- ඕලුගංතොට කරදියමුල්ල මාර්ගය අසළ තිබූ කොට්ටා ගස ඉවත් කිරීමේදී හානි වූ විදුලි කණුවට හා ගසේ කැපුම් ගාස්තු තම 2020 මන්ත්‍රී ප්‍රතිපාදන වල ඉතිරි කොටසින් ගෙවන ලෙස ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ ඉතිරිව ඇති මන්ත්‍රී ප්‍රතිපාදන වලින් මෙම හානි වූ විදුලි කණුවේ ගාස්තුව ගෙවීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා එම කොට්ටා ගස කැපීම සඳහා රු.30,000.00 ක මුදලක් ඇස්තමේන්තු ගත කර ඇති අතර එතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.57,000 ක මුදලක් ඉතිරිව පවතින බව දන්වා ඇති බැවින් එම මුදල් වලින් කොට්ටා ගස කැපීමේදී විදුලි කණුවට සිදු වූ අලාභය පියවීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් එසේ සිදුවන අලාභ හානි මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ගෙවිය හැකි දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එසේ අලාභ හානි ගෙවීම සඳහා සභා අරමුදල් වෙන් කිරීම නීත්‍යානුකුල නොවන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් එම කොට්ටා ගස කැපීමට තමන්ගේ කිසිඳු විරුද්ධත්වයක් නොමැති බව ද එම විදුලි රැහැන් නිසියාකාරව ඉවත් කළ නොහැකි බවද එසේ ඉවත් කළේ නම් කිසිඳු හානියක් සිදු නොවන බවද පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් එම ගස කපන අවස්ථාවේදී විදුලි බල මණ්ඩලය මඟින් විදුලි රැහැන් ඉවත් කර දී එක් විදුලි රැහැනක් පෙන්වා එය ඉවත් කර දීමට අවශ්‍ය දැයි විමසා ඇති අතර එහිදී ගස් කැපුම්කරු විසින් එය ඉවත් කිරීම අනවශ්‍ය බව පවසා ඇති බවද ගස ඉවත් කරන විට ගසේ අත්තක් කඩා වැටී විදුලි කණු කඩා වැටී ඇති බවද තමන්ට එය ආරංචි වූ අවස්ථාවේදී නිරීක්ෂණයට ගිය අතර එහි දී ගස් කැපූ පුද්ගලයා මෙම සිද්ධිය පිළිබඳ නොදන්නා බව පැවසූ බවද මේ සඳහා රු.35,000.00 ක හෝ රු.40,000.00 ක මුදලක් ගෙවීමට සිදු වන බව පැවසු බවද පවසන ලදී. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමාගේ මෙම ඉල්ලීම සාධාරණ වුවද මන්ත්‍රී ප්‍රතිපාදන වලින් අලාභ හානි ගෙවීමේ හැකියාවක් නොමැති අතර ගස් කැපීමේ මුදල වැඩි කර හෝ එය ගෙවිය යුතු වන බවද එසේ නැතහොත් ගැටලුවක් ඇති වන බවද අමතර මුදලක් ගෙවන්නේ නම් ඒ සඳහා අනුමැතිය සභාවෙන් ලබා ගත යුතු බව ද පවසන ලදී.

අනතුරුව සභාවේ සිදුවූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව වැඩ අධිකාරි වාර්තාව ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව තීරණය විය.

- අලුත්නුවර ඉඹුල්පේ පදිංචි මහේෂිකා දිල්රුක්ෂි මහත්මිය විසින් බළන්ගොඩ වෙළෙඳසැල් හා බැංකු ආශ්‍රිත ප්‍රදේශයකින් අඩි 20 පළල අඩි 40 දිග බිම් කොටසක් 2021-03-15 දින සිට 2021-04-10 දින දක්වා පෝසිලේන් අලෙවි සැලක් සඳහා ලබා දෙන ලෙස පවසා ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා දැනට පවතින ආර්ථික තත්ත්වය හමුවේ බළන්ගොඩ ව්‍යාපාරිකයා ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු බවද මෙසේ

අලෙවිසැලක් සඳහා ඉඩකඩ ලබා දුනහොත් බළන්ගොඩ ව්‍යාපාරිකයා අපහසුතාවයට ලක්වන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙය ව්‍යාපාරිකයින් කඩා වැටී ඇති අවස්ථාවක් බවද පසුගිය කාලයේ සහරාන් සිද්ධියේදී හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ව්‍යාපාරිකයින් බැට කෑ බවද ක්‍රීඩාපිටියේ කිසිඳු පුද්ගලයෙකුට භාණ්ඩ අලෙවි කිරීමට හිටපු ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ඉඩ ලබා නොදුන් අතර ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වන අතර, එය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරන බව ද පවසන ලදී. එමෙන්ම මින් ඉදිරියටත් බළන්ගොඩ ව්‍යාපාරිකයා ආරක්ෂා කරන ලෙසද මෙසේ සේල් කඩවලට අවසර ලබා දීමට තමන් පෞද්ගලිකව විරුද්ධ වන බවද මෙම පුද්ගලයාට ලබා දීමට අවශ්‍ය වන්නේ නම් උත්සව සමය මඟහැර වෙනත් කාලවලදී මේ සඳහා අවසර ලබා දෙන ලෙසද පවසන ලදී.

සභාවේ සිදු වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව මෙම අලෙවි සැල සඳහා අවසර ලබා නොදීමට තීරණය විය.

- 271/ඩී/6 රණවිනාවත්ත, කෝපිවත්ත පාර, තුඹගොඩ, බළන්ගොඩ ලිපිනයේ පදිංචි එම්.කේ.නිල්මිණි සජීවනී විජේවර්ධන යන අය විසින් සුදර්ශනගම ඉහළ මාර්ගයේ ගාමිණී සිරිලාල් මහතාගේ නිවස අසළින් ආරම්භ වන වැසි ජලය තම නිවස පිටුපසින් පිහිටා තිබෙන කාණුව හරහා ගලා යන බව ද එහිදී තම නිවසින් කොටසක් ජල කාණ්ඩුවකට ලක්වන බැවින් එම කාණු පද්ධතිය නිසි පරිදි සකස් කොට බෝක්කු සවිකර දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් සුදර්ශනගම ඉහළ මාර්ගයෙන් එන වැසි ජලය මෙතුමියගේ නිවස පිටුපසින් ඇති කාණුවෙන් ගලා බසින අතර වැසි ජලය වැඩි අවස්ථාවලදී පිටාර ගලා යන බැවින් බෝක්කු සවිකර දෙන ලෙස මෙතුමිය ඉල්ලා සිටින බවද මේ දිනවල මාර්ග කාපට් කිරීමේ දී ඉවත්කරන ලද බෝක්කු කිහිපයක් තමන් ලබා ගෙන තිබෙන අතර එම බෝක්කු ප්‍රමාණවත් වන්නේනම් මේ සඳහා ලබා දිය හැකි බව ද පවසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ වැඩ අධිකාරිතුමාගේ වාර්තාව ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත හැකි බවත් මේ වන විට සභාවට දැරිය හැක්කේ පුනරාවර්තන වියදම් පමණක් බවත්ය.

- සේනක පෙදෙසේ අංක 35 නිවසේ ජීවත්වන ටයිටස් යන අයගේ නිවස පිටුපස ඉඩමේ නිවසක් ඉදිකරගෙන යන අතර ඔවුන් විසින් නිසි පරිදි කාණු පද්ධතියක් සකස් කර නොමැති බැවින් තම නිවස මැදින් වැසි දිනවලදී ජලය ගලා යන බවත් මේ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙම පුද්ගලයා මෙම ප්‍රදේශයේ ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් අතරින් එක් පවුලක් වන අතර ඔවුන් මෙම නිවසට පිටුපසින් නිවසක් ඉදිකර ඇති බවද එහිදී මෙම නිවසට වැසි ජලය ගලා එන බවද මෙම ස්ථානයේ ජල උල්පත් තිබෙන අතර මෙම නිවෙස් වලට බැම් ඉදි කර නොමැති බවද පවසන ලදී.

- චතුර ලීබඩු වෙළෙඳසැල අසළ ත්‍රීරෝද රථ සංගමයේ ත්‍රීරෝද රථ හතරක් පවතින අතර එම ස්ථානය ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ ත්‍රීරෝද රථ සංගමය විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව වන බලපෑම අපට වඩා හොඳට හඳුනන්නේ පොලිසිය බවද රථවාහන පොලිසිය කැඳවා අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් ඉදිරියේදී කටයුතු කරන බවද පවසන ලදී. එමෙන්ම මෙම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියේ රක්ෂිතයක් වන බැවින් මෙය ලබා දීමට සභාවට නෛතික ප්‍රතිපාදන නොමැති බවද පවසන ලදී.

- අංක 25/25, මොහාන් සාලිය එල්ලාවල මාවත, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි සුමේන්ද්‍ර රොෂාන් ජයතිලක මහතා විසින් මොහාන් සාලිය එල්ලාවල මාවතේ බස්නැවතුම්පලට පිවිසෙන ස්ථානයේ කහ ඉර අසළ ඇති විදුලි බුබුල දිගු කාලයක සිට අක්‍රියව පවතින බව පවසා එම ස්ථානයට විදුලි බුබුලක් සවිකරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- 306/18, අලාබ්දීන් මාවත, මිරිස්වත්ත, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.එච්.එම්.කලීල් මහතා විසින් මිරිස්වත්ත ග්‍රාමයේ පිහිටා ඇති අලාබ්දීන් මාවත බොහෝ කලක සිට පිළිසකර කර නොමැති බැවින් එම මාර්ගයේ කාණු පද්ධතිය නිසි ලෙස සකස් කර දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම ලිපි ඉදිරිපත් කරන අයට මේ පිළිබඳව පිළිතුරක් සටහන් කර ලිපියක් යැවිය නොහැකිදැයි විමසූ අතර, එසේ ලිපියක් හෝ නොයවන්නේ නම් මේ පිළිබඳව නොසළකා හරින බවට මහජනතාව සිතනු ඇති බව පවසන ලදී.

- අංක 40, සුදර්ශනගම, තුඹගොඩ, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි චමිල ක්‍රිශාන්ත යන අය බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය කම්කරු ලෙස සේවය කරන අතර එහිදී තම රාජකාරියෙන් ඔබ්බට ගොස් යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම වැනි රාජකාරියන්හි යෙදුණු අතර මින් ඉදිරියට එම රාජකාරිය ලිඛිතව ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් සභාවට තනතුරු නාමය වෙනස් කළ නොහැකි අතර එය වෙනස් කළ හැක්කේ පත්වීම් බලධාරියාට බවද සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කරන්නෙකුට යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව වැනි කටයුතු යොදා රාජකාරි ලැයිස්තුවක් නිකුත් කළ නොහැකි බවද පවසන ලදී.

- 54/9, කරව්කැටිය, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එස්.රාජ්කුමාර් මහතා විසින් සේනාලංකාර මාවතේ කොටසක් 2019 වර්ෂයේ දී කොන්ක්‍රීට් කර ඇති අතර නිවාස 20 ක් පමණ ඇති මෙම මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කර සාදා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**04ඃ01** වීථි පහන් සඳහා අවශ්‍ය ලයින් ටැප් හා කෝබ්‍රා ලයිට් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

වීථි පහන් සඳහා අවශ්‍ය ලයින් ටැප් හා කෝබ්‍රා ලයිට් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ලයින් ටැප් සඳහා ටෙන්ඩර්පත් 08ක් ද කෝබ්‍රා ලයිට් සඳහා ටෙන්ඩර්පත් 12 ක්ද ලැබී තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05ඃ01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

05ඃ01ඃ01 2015 පසු නගර සභාවේ සේවය කර විශ්‍රාම ගිය කම්කරුවන් සහ නිළධාරීන් කොපමණද?

කම්කරුවන් - 9
නිලධාරීන් 5

05ඃ01ඃ02 එම අයගේ සේවය හා තනතුරු මොනවාද?

| | | |
|---|---|---|
| ආදායම් පරීක්ෂක | 2 | දෙපාර්තමේන්තු සේවය |
| ආයුර්වේද වෛද්‍ය නිලධාරී | 1 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරී සේවය |
| පෙර පාසල් ගුරු | 2 | දෙපාර්තමේන්තු සේවය |
| රියදුරු | 1 | |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | 5 | |
| සෞඛ්‍ය කම්කරු | 3 | |

05ඃ01ඃ03 එම තනතුරු වලට මෙම කාලය තුළ කීදෙනෙක් බඳවාගෙන තිබේද?

| | |
|---|---|
| ආදායම් පරීක්ෂක | 2 |
| ආයුර්වේද වෛද්‍ය නිලධාරී | 1 |
| පෙර පාසල් ගුරු | 1 |
| අනියම් වැඩ ක්ෂේත්‍ර කම්කරු | 4 |

අනියම් සෞඛ්‍ය කම්කරු 1

05ඃ01ඃ04 එම තනතුරු මොනවාද? බඳවා ගැනීම නීත්‍යානුකූල ක්‍රියාපටිපාටියට සිදු කලාද යන්න පැහැදිලි කරන්න.

ආදායම් පරීක්ෂක - ආදායම් පරීක්ෂක තනතුර සඳහා වන තරග විභාගය මගින්

ආයුර්වේද වෛද්‍ය නිලධාරී - ආයුර්වේද වෛද්‍ය නිලධාරී සඳහා වන තරග විභාගය මගින්

පෙර පාසල් ගුරු - කොළඹ මහ නගර සභාවේ සිට ස්ථාන මාරු

අනියම් වැඩ ක්ෂේත්‍ර කම්කරු හා අනියම් සෞඛ්‍ය කම්කරු තනතුරු - දින 180 අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති කණිෂ්ඨ සේවකයින් ස්ථිර කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ DCSPT/13/P-2/17/Primary/Dep/02 හා 2019-02-28 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි ගරු ආණ්ඩුකාරතුමිය විසින් ලබා දී ඇති අනුමැතිය අනුව බලංගොඩ නගර සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරට හා සෞඛ්‍ය කම්කරු තනතුරු වලට 2019.03.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මොවුන් පත් කර ඇත.

05ඃ01ඃ05 ගිය වර්ෂයේ කොවිඩ් 19 නිසා ඉරිදා සතිපොළ දින කීයක් වසා තැබුවේද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ 2020-03-15 දින සිට අප්‍රේල්, මැයි හා ජූනි 14 දක්වාත්, 2020 නොවැම්බර් 01 සිට නොවැම්බර් 27 දක්වාත් මහජන පොළ වසා තිබුණු බව පවසන ලදී.

**05ඃ02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05ඃ02ඃ01 නගර සභාවට අයත් බුද්ධ ජයන්ති මාවතේ ඉහළ කොටසේ ඇති ඉඩමට පසුගිය දිනක කිසියම් පිරිසක් බලහත්කාරයෙන් ඇතුළු වී මායිම් සළකුණු කර වැටවල් ගසා තිබුණි. ඒ සම්බන්ධයෙන් සභාව ගත් ක්‍රියාමාර්ගය කුමක්ද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ, අදාළ කාර්යය සම්බන්ධයෙන් පසුදින උදෑසන ලැබුණු නිර්නාමික දුරකථන ඇමතුමක් මගින් වැඩ අධිකාරි මහතා දැනුවත් කර තිබුණු අතර ඒ අනුව වැඩ අධිකාරිතුමා විසින් ලේකම්තුමිය හා ගරු සභාපතිතුමා දැනුවත් කරන ලදුව අදාළ ඉඩමේ අප ළඟ ඇති පිඹුරු පිටපත් අනුව මිනින්දෝරු ඊ.ටී.පී.පෙරේරා මහතා කැඳවා ඔහු ලවා සභාවට අයත් ඉඩමේ මායිම් තහවුරු කරගෙන වැඩ අධිකාරි විසින් පොලිසියේ මෙම අනවසර වැට ගැසීම සම්බන්ධව පැමිණිල්ලක් කර අදාළ වැට කණු ගලවා

ඉවත් කරන ලද බවයි. ඉන් පසු මිනින්දෝරු ඊ.ටී.පී.පෙරේරා මහතා ලවා අදාළ ඉඩමේ දැනට ඉතිරිව ඇති කොටස කම්බි ගසා තහවුරු කරන ලදී. ඊට අමතරව අදාළ ඉඩමෙන් කොටසක මේ වන විට අනවසරයෙන් පදිංචිව සිටින කොටස වෙනම දැක්වෙන පරිදි සිතියම් ගත කොට ලබා දෙන ලෙස මිනින්දෝරු මහතාට දැනුම් දෙන ලදී. මෙම ඉඩමේ නගර සභාව සතුව පර්චස් 76.3 ක් පවතින නමුත් මේවන විට පර්චස් 47.9 ක් පමණක් ඇති අතර පර්චස් 28.4 ක ජනතාව පදිංචිව සිටින බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් මෙම ඉඩමේ එම ජනතාව ජීවත් වන්නේ කවදා සිටදැයි විමසන ලදී.

ලේකම්තුමිය විසින් මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**05:03 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

05:03:01 සභාව සතු තලාව ඉඩම් කොටස කට්ටි කිරීමේදී පර්චස් ප්‍රමාණය කොපමණද? ඉදිරියේදී එම ඉඩම් කොටසේ කුමන ව්‍යාපෘතියක් කිරීමට බලාපොරොත්තු වන්නේද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, තලාව සතු ඉඩම් කොටස මොනම අවස්ථාවක හෝ කට්ටි කිරීම් සිදු කර නොමැති අතර ඉදිරියේදී එම ඉඩම් කොටස තුළ නැරඹුම් මැදිරියක් ඉදිකිරීමට නියමිතව ඇති බව පවසන ලදී.

05:03:02 බස්නැවතුම්පල කඩ කාමර ඩී 01/01 කාමරය කුලී ගෙවමින් පවතීද? එය වසා තැබීමට හේතු මොනවාද?

ඉහත කඩ කාමරට සඳහා කඩ කුළිය නිසි පරිදි මාසිකව ගෙවමින් සිටින බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

**05:04 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05:04:01 කොම්පෝස්ට් අංගනයේ ඇති ජල බවුසරය ඉවත් කර ඇත්තේ මන්ද?

එහි පොම්පය අක්‍රීය වීම හේතුවෙන් හා ප්‍රවාහනය අපහසු වන බැවින් එය ඉවත් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

05:04:02 ඇල්ලෙඅරාව ගරාජයේ ඇති ට්‍රැක්ටර් රථය අයින් කර ඇත්තේ මන්ද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත ප්‍රශ්නය පැහැදිලි නොමැති බවයි.

05:04:03 ගල්වල භූමියේ දිරාපත්වන ට්‍රැක්ටර් රථය එසේ දිරාපත්වන්නේ මන්ද?

මෙය නගර සභාව සතු ට්‍රැක්ටර් රථයක් නොවන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

05:04:04 සේනක පෙදෙසේ ගලිවලවල්/ ගලි බවුසර් ප්‍රශ්නයට විසඳුමක්?

සේනක පෙදෙසේ නිවාස දෙකක පමණක් ගලි වලවල් උතුරා පිටතට ගලා ගිය අතර එම ගලි වලවල් දෙක නොමිලේ ඉවත් කර දෙන ලද බව පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**06:01:01** 2020-12-31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:02** පවතින ගෝලීය වසංගත තත්ත්වය හමුවේ එළඹෙන උත්සව සමයේදී නගරය කරා ඇදී එන ජනතාව සෞඛ්‍ය උපදේශයන්, ආරක්ෂක ක්‍රමවේදයන් සිහිගැන්වීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා අවුරුදු උදාන බළන්ගොඩ - 2021 වැඩසටහන සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:03** 342/ ඒ, එගොඩවත්ත, බුලත්ගම, බළන්ගොඩ ලිපිනයේ පදිංචි ආර්.පී.එම්.බණ්ඩාර මැණිකේ නැමති අයගේ වරිපනම් අංක 301,303 දරණ බිල්පත් සඳහා වූ ගොඩනැගිල්ල මේ වන විට නොමැති බැවින් 2021 වර්ෂයේ සිට මෙම දේපළ ඉඩමක් ලෙස සළකා වරිපනම් බදු අය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:04** රාස්සගල පාර වරිපනම් අංක 340 1/1 උළු සෙවිලි කරන ලද නිවසෙහි උඩු මහළෙහි වරිපනම් බදු නිදහස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:05** බළන්ගොඩ නගරයේ LED ඩිජිටල් නාම පුවරුව අංක 99, බළන්ගොඩ පාර, පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි ඩී.එස්.බී.පී. අබේගුණවර්ධන මහතාගේ නමින් 2021 වර්ෂයේ සිට ගිවිසුම් ගත වීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:06** අංක 105, කෙළින් වීදිය, බළන්ගොඩ දරණ ලිපිනයේ පදිංචි කුසුමා රංජනී ධර්මප්‍රිය මහත්මියගෙන් අංක 105 දරණ ගොඩනැගිල්ලට අදාළව 2015 වර්ෂයේ සිට වැඩිපුර අය කර ඇති රු.12,606.22 ක මුදල නව තක්සේරුව යටතේ ඉදිරි වර්ෂ සඳහා හිලව් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:07** 2020 නොවැම්බර් දෙසැම්බර් මාසවල බළන්ගොඩ නගර සභා තානායම් කුලිය සඳහා එකතු කර ඇති රු.90000.00 ක දඩය කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙසේ තානායමේ දඩ කුලිය කපා හරින්නේනම් සභාවේ අනෙකුත් දේපළවලින් අය කරන දඩයද නිදහස් කරන ලෙස පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් දැනට පවතින තත්ත්වය තුළ තමන් නීත්‍යානුකූල ගැටලුවක හිරවී සිටින බැවින් මෙම කාරණය සඳහා විරුද්ධ වීමට සිදු වන බවද ආයතනයට අයවිය යුතු සියලු මුදල් අයවිය යුතුය යන මතය තමන් දරණ බවද පවසන ලදී. එබැවින් මේ සඳහා බෙදීමකට යා යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මින් ඉදිරියටද මෙවැනි ලෙස සභා ආදායම් කිසිවක් අඩු කිරීම් නොකරන ලෙස පවසන ලදී.

තමන් අධිකරණ නඩුවකට පෙනී සිටින බැවින් එහිදී සභාව විසින් සාමූහිකව ගත් තීරණ ද එහිදී අභියෝගයට ලක්ව ඇති බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳව සභාවේ තීන්දුවක් ලබා ගෙන එය ආණ්ඩුකාරතුමා වෙත යැවීම සුදුසු වන අතර එහිදී එතුමා විසින් මේ පිළිබඳව තීරණයක් ගනු ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ හරක් මස් කඩයේ කුලි අඩු කරන ලෙස අදාළ ටෙන්ඩර්කරු ඉල්ලා තිබුණේ ටෙන්ඩර් කොන්දේසි කඩ කිරීමට ලක්කර වන බවද බළන්ගොඩ තානායම යනු නගර සභාවට දීර්ඝ කාලීනව කුලි ගෙවමින් සිටින ආයතනයක් වන බැවින් ඔවුන් කර ඇති ඉල්ලීමට අනුව මෙම තීරණය ගෙන ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීම සුදුසු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභාවේ සාමූහිකව ගන්නා තීරණ වලට තමන්ට තනිවම මුහුණ දීමට සිදු වන බැවින් රජයේ ආදායම අහිමි කළා යැයි චෝදනාවලට ලක්වී තමන් වැරදිකරුවෙකු වීමට මෙය ප්‍රමාණවත් බවද පවසන ලදී. මීට පෙර සෑම අවස්ථාවකදීම මෙවන් ඉල්ලීම් වලට තමන්ගේ අනුමැතිය ලබා දී ඇති බවද මේ අවස්ථාව වන විට නීති ප්‍රශ්නයක් නිසා මේ සඳහා එකග වීමට නොහැකි බවද පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් ඉහත යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී

මේ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද රහස් ඡන්දයක්ද යනුවෙන් විමසන ලදී.

එහිදී මේ සඳහා විවෘත ඡන්දයක් සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම දඩය පිළිබඳ ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනාස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

අනතුරුව ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පොදුවේ කිසිඳු දඩයක් නිදහස් නොකරන බවට පොදුවේ තීරණයක් ගන්නේ නම් ඡේදීමකට යාම අනවශ්‍ය බව පවසන ලදී.

අනතුරුව ගරු සභාවේ 2020 නොවැම්බර් දෙසැම්බර් මාසවල බළන්ගොඩ නගර සභා තානායම් කුලිය සඳහා එකතු කර ඇති රු.90,000.00 ක දඩය කපා හැරීම සඳහා ඡේදීමක් අවශ්‍ය බවට යෝජනා ස්ථිර වී ඇති බැවින් මේ සඳහා ඡේදීමකට යන ලදී.

එහිදී එම යෝජනාවට පක්ෂව ගරු සභිකයින් තිදෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රීනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |

යන අයද, එම යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් පස් දෙනෙකුද, එනම්.

| | |
|---|---|
| 01. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය |
| 05. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |

විසින් ඡන්දය ප්‍රකාශ කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී

එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ඡන්දය ප්‍රකාශය කිරීමෙන් වැළකී සිටින ලදී. ඒ අනුව ඉහත යෝජනාව වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

**06:01:08** 2021-02-18 පැවති පුස්තකාල උපදේශක කමිටු යෝජනා සභාවට ඉදිරිපත් කිරීම.

- ✓ පුස්තකාලය දීර්ඝ කාලයක් වසා තැබීම හේතුවෙන් මෙවර සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීමට ඉදිරිපත්වන දරුවන්ට අසාධාරණයක් වීම හේතුවෙන් විමර්ශන අංශයට පමණක් සිසුන් සීමිත පිරිසක් සෞඛ්‍ය උපදෙස් මත ගෙන්වා ගැනීමට සභාව මඟින් දිස්ත්‍රික් කොරෝනා කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීම.
- ✓ පුස්තකාලයේ පුවත්පත් උදෘත පවත්වාගෙන යාම සඳහා දිනපතා ලංකාදීප හා මවුබිම පුවත්පත් මිළදී ගැනීමට අනුමැතිය
- ✓ පුස්තකාලයේ නාම පුවරුව සෑදීම.
- ✓ පුස්තකාලයේ විමර්ශන අංශයේ විදුලි පංකාව කැඩී ඇති බැවින් නව විදුලි පංකාවක් සවි කිරීම සහ කැඩී ඇති දොරවල්, ජනෙල් සහ අල්මාරිවල වීදුරු සහ අගුල් සවි කිරීම.
- ✓ අබලි වී ඇති පුවත්පත් මේසය ලබා ගැනීම.
- ✓ පිරිසි සහිත කෝප්ප 24 ක් ලබා ගැනීම.
- ✓ විදුලි බල්බ සවි කිරීම.
- ✓ 2021 වර්ෂයේ පුස්තකාල උපදේශන කමිටුවේ ප්‍රජා නියෝජන සාමාජිකයින් ලෙස නාගරික සීමාව තුළ පාසැල්වල විදුහල්පතිවරුන් පත්කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. එමෙන්ම ප්‍රජා නියෝජිතයෙකු වශයෙන් නලීන් ජයසේකර ( යශෝධරා විශේෂ පාසල් ගුරුතුමා ) මහතාද පත්කර ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ඉහත යෝජනා සියල්ල කඩිනමින් ඉටු කරන ලෙසද පුස්තකාල උපදේශන සභාව සඳහා අවට පුස්තකාලවල පුස්තකාලාධිපතිවරුන් කැඳවා ගැනීම තුළින් වැදගත් යෝජනා ලබා ගත හැකි බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:09** QL -2901 ත්‍රීරෝද රථයේ ක්ලච් ප්ලේට් සහ කැබ් හෝල්ට් එකක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴10** 56-1906 කෘෘ කැබ් රථයේ පවර් ස්ටියරින් පොම්පය ක්‍රියා විරහිත වී ඇති බැවින් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. - නැෂනල් මෝටර්වේස් - 22750.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴11** 226-7521 ටිපර් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා නැෂනල් මෝටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.49325.00 ක අවම මිළ ගණන සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- එන්ජින් ඔයිල් ලීක් එක සෑදීම.
- ජියර් බොක්ස් මවුන්ට් එක දැමීම.
- වෝටර් ෆෑන් එක සෑදීම.
- බ්‍රේක් පද්ධතිය හා ක්ලච් පද්ධතිය පරීක්ෂා කර ඔයිල් අඩුවන දෝෂය සැකසීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴12** 2021 වර්ෂයට අදාළව කාර්යාලීය හා සේවකයින් සඳහා නිළ ඇඳුම් ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06៖01៖13** ආපදා ණය ලබා ගැනීම

- සංවර්ධන නිළධාරි - ආර්.කේ.එස්.එම්.එස්.නන්දසේන මයා
- කාර්යාල කාර්ය සහයක - මහේෂ් ධනංජය පද්මපෙරුම මයා
- කාර්යාල කාර්ය සහයක - ඉරේෂ් මධුසංක හෙට්ටිආරච්චි මයා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06៖01៖14** 2021 මාර්තු මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත නඩත්තු

01. දංගමුව වලව්ව පාර දෙවන වර තාර දැමීම.

02. ගමගෙදර පාර නඩත්තු කිරීම.

03. මුස්තාපා මාවත හා සුබයිර් අලීම් මාවත නඩත්තු කිරීම.

04. කල්තොට පාරේ 1 වන කණුව අසල සිට කුමාරගම මාර්ගය නඩත්තු කිරීම.

05. මුගුණමලේ පාර තාර දැමීම

06. බෝම්බුව ආචාරිමලේ මාර්ගය නඩත්තු කිරීම.

07.කිරිඳිගල ජල සම්පත් මණ්ඩලයට යන මාර්ගය දෙවන වර තාර දැමීම.

08. පල්ලෙකුඹුර මාර්ගය තාර යෙදූ කොටස නඩත්තු කිරීම.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**

1 1 /2 ගල් කියුබ් 04

3/4 ගල් කියුබ් 04

1 /2 ගල් කියුබ් 04

වැලි කියුබ් 05

සිමෙන්ති 20

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ15** රු.10000.00ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021/02/05 | සුහද වැඩිහිටි සමිතිය - බෝම්බුව පන්සලවත්ත පාරේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 06 | 048486 | 73212/10 |
| 2021/02/08 | එම්.එෆ්.එම්.රවුෂාන් - පොදු වෙළඳසැල අංක 16 ගවමස් කඩ කාමරය ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 07 | 048487 | 488550/= |
| | එම්.එන්.එම්.රිස්වි - පොදු වෙළඳසැල අංක 15 එළුමස් කඩ කාමරය ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 08 | 048488 | 26250/= |
| | ජාසින්කන්ද ගැමුණු වැඩිහිටි සමිතිය - කොටුගොඩැල්ල ගල්වල මාර්ගය අවශ්‍ය ස්ථාන පෙරනිම් මිශ්‍රණ යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය වෙනුවෙන් මුදල් ගෙවීම. | 09 | 048489 | 882593/27 |
| 2021/02/09 | Dialog Broadband Networks pvt ltd - කාර්යාලීය අන්තර්ජාල හා දුරකතන බිල්පත් ගෙවීම 2021 ජනවාරි මාසය | 13 | 049153 | 18389/80 |
| 2021/02/09 | දෛනික වැටුප් | 22-5 | 049159 | 340165/92 |
| | දෛනික වැටුප් | 22-6 | 049159 | 930851/25 |
| | දෛනික වැටුප් | 22-7 | 049159 | 76800/= |

| | | | | |
|---|---|---|---|---|
| | දෛනික කසල ඉවත් කිරීම- සම්පත් පියසස | 22-8 | 049159 | 27650/= |
| | බැංකියවත්ත කොම්පෝස්ට් පොලිතින් ඉවත් කිරීම | 22-9 | 049159 | 72800/= |
| | බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ වැටුප් | 22-10 | 049459 | 48750.00 |
| | එම්.එන්.එම්.රිස්වි - පොදු වෙළඳසැල අංක 17 කඩ කාමරය ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 25 | 049179 | 36000.00 |
| 2021-02-15 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 35 | 049182 | 51303.60 |
| | ලංකා විදුලිබල මණ්ඩලය - | 37 | 049183 | 11582.40 |
| 2021-02-17 | බී.විනෝදනී ප්‍රේමිකා - නගරය පවිත්‍ර කිරීමේ ටෙන්ඩරය වෙනුවෙන් ගෙවීම | 42 | 049188 | 320050.00 |
| | ආර්.කේ.දයාරත්න - දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම | 45 | 049191 | 250000.00 |
| | බෝවත්ත විවේකාරාම වැඩිහිටි සමිතිය - කරව්කැටිය ගල්වල පාර පැති කාණුව ඉදි කිරීමේ කර්මාන්තයේ 10% රඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 46 | 049192 | 82865.51 |
| | ඒ.කේ.විමලනාථ - 2020 වර්ෂයේ දැන්වීම් පුවරු ටෙන්ඩරය අදාලව ගිවිසුම් ඇප මුදලින් හිග ගාස්තු අය කර ඉතිරි මුදල ගෙවීම | 48 | 049194 | 70950.00 |
| 2021-03-1 | බී.විනෝදනී ප්‍රේමිකා - නගරය පවිත්‍ර කිරීමේ ටෙන්ඩරය වෙනුවෙන් ගෙවීම | 4 | 049228 | 320050.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06#01#16** බළන්ගොඩ නගර සභාව සතු වාහන තක්සේරු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06#01#17** 56-1906 කෘා කැබ් රථයේ ජියර් බොක්ස් එක ගලවා ක්ලච් ප්ලේට්, ප්‍රෙෂර් ප්ලේට්, ක්ලච් රේසර් ප්‍රයිවීල් රේසර් දමා පද්ධතිය සකසා අලුත් වැඩියා කිරීම සඳහා අදාළ නැෂනල් මෝටර්වේස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.34,400.00 මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:18** PF 4006 කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ ඉන්ජිනියරින් ආයතනය වෙත රු.15,288.00 ක මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:19** RD -8000 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටිය ගලවා ප්‍රෙෂර් ප්ලේට් එක, ප්‍රයිවීල් රේසර් 01,ක්ලච් රේසර් 01, බ්රේක් ලයිනර් 02 ක් අලුතින් දමා නැවත සවි කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.44,650.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:20** HF 7899 JCB යන්ත්‍රය සඳහා ටර්බෝ එකක් දමා සවි කිරීම සදහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.86,800.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:21** RC - 8183 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටිය ගලවා ප්‍රෙෂර් ප්ලේට් 01, ක්ලච් ප්ලේට් 01, ප්‍රයිවීල් රේසර් 01, ක්ලච් රේසර් 01, බ්රේක් ලයිට්, ෂීට්, බ්‍රේක් ලයිනර් 04 අලුතින් දමා සවි කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.100,600.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴22** RC -1118 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටිය ගලවා ප්‍රෙෂර් ප්ලේට් 01, ක්ලච් ප්ලේට් 01, ප්‍රයිවීල් රේසර් 01, ක්ලච් රේසර් 01, බ්රේක් ලයිට්, ෂීට්, අලුතින් දමා සවි කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.65,250.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴23** නව බස්නැවතුම්පල සී - 17 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින්, කීමනි කඩ කාමරවල අයිතිය වෙනස් කිරීමට අවශ්‍ය නම් 2021 ජනවාරි මස සිට ජූනි මස දක්වා කාලය තුළ එය සිදු කිරීමට හැකි බව ආණ්ඩුකාර කාර්යාලය විසින් දන්වා ඇති බව ද මෙය සබරගමුව පළාත තුළම විශාල ගැටලුවක් බවට පත්ව ඇති බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින්, මෙම කඩ කාමරයක බදු අයිතිය වෙනස් කිරීම තුළ සභාවට ඉතා සුලු මුදලක් ලැබෙන අතර ඒ වෙනුවෙන් ලක්ෂ ගණනින් අතයට ගණුදෙනු සිදුවන බව ද එබැවින් සභා දේපලවල නම වෙනස් නොකරන බව ද පවසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙහි වර්ථමාන බදුකරු වන ගොලුහේවාගේ සුමතිපාල මහතා විසින් කුමාරි වන්නි ආරච්චි යන අය වෙත අතුරු බදු ලබා දී ඇති බව අනාවරණය වී ඇති අතර ප.පා.කො. චක්‍රලේඛ 03/2020 පරිදි කටයුතු කරමින් මෙම කඩ කාමරයේ පෙර ගෙවුම් මුදලින් 25% ක මුදලක් සභාව වෙත ගෙවීමෙන් පසු අතුරු බදුකරු වන කුමාරි වන්නි ආරච්චි යන අයට මෙම කඩ කාමරය පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴24** සබරගමුව පළාත් සභාවේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වන දේශිය නිෂ්පාදන (කිතුල් පැණි, කිතුල් හකුරු, මල් පැළ ආදිය) අලෙවි කිරීම සඳහා සෑම බදාදා දිනකම බළන්ගොඩ මහජන පොළ ලබා දිම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:25** අප්‍රේල් මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

2021 අප්‍රේල් මස මහ සභාව යෙදී ඇත්තේ 13 වන දින බැවින් 2021 අප්‍රේල් මස මහ සභාව අප්‍රේල් 06 වන දින පැවැත්වීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:26** පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරයේ කඩ කුලී නොගෙවීම මත අංක 03 දරණ කඩ කාමරය 2021-03-08 වන දින මුද්‍රා තැබූ බවැන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරයේ අවම ලංසු මුදල ලෙස යොදා සීමිත ටෙන්ඩර්පත් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.01.27** 2020 - භාණ්ඩ සමීක්ෂණ හා අපහරණ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව භාණ්ඩාගාර 66 හි අතිරික්ත භාණ්ඩ ලෙස සඳහන් භාණ්ඩ කල්පවත්නා භාණ්ඩ ලේඛනවලට ඇතුළත් කිරීමටද භාණ්ඩාගාර 66 හි "S" අක්ෂරයෙන් හා "D" අක්ෂරවලින් සඳහන් භාණ්ඩ කල්පවත්නා ලේඛන වලින් ඉවත් කිරීමටත් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

**07:01:01.** කිරිදිගල කළුවැල්ලකැලේ පාරේ සපත්තු පාලම පෙට්ටි බෝක්කුවක් ලෙස ඉදි කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනාව සංවර්ධන යෝජනාවක් වන අතර ප්‍රාග්ධන වියදම් දැරීමට අවස්ථාව නොමැති හෙයින් මෙම යෝජනාව ඉටු කිරීමට නොහැකි බවද එබැවින් ගරු මන්ත්‍රීවරුන් යෝජනා ඉදිරිපත් කිරීමේදී නඩත්තු යෝජනා පමණක් ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා**

**07:02:01** පසුගිය කර්මාන්ත කමිටුවකින් සහ සභාවකින් අනුමැතිය ලබාදෙන ලද සඳුන්ගම ධනසිරි මහතාගේ නිවස මාර්ගය සංවර්ධනය සඳහා ජේ.සී.බී.යන්ත්‍රය ලබා දී එම මාර්ගය සකස් කරදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමආරච්චි මැතිතුමා**

**07:03:01** පසුගිය කාලසීමාවේ කර්මාන්ත කමිටුව විසින් අනුමත කළ පහත සඳහන් නඩත්තු ක්‍රියාත්මක කිරීම.

- පල්ලෙවෙල පාර කෙළවරෙහි කඩා වැටී ඇති බෝක්කුව සංවර්ධනය කිරීම.
- දෙණියකුඹුර පාර නඩත්තු කිරීම.
- බුලත්ගම පොදු සුසාන භූමියේ අත්‍යවශ්‍ය නඩත්තු කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් පවසා සිටියේ පල්ලෙවෙල පාර කෙළවරෙහි කඩා වැටී ඇති බෝක්කුව සංවර්ධනය කිරීමේ යෝජනාව 2020 නොවැම්බර් මස මහ සභාවේ අනුමත වූ අතර දෙනිය කුඹුර පාර ශුද්ධ කර අවසන් අතර එම මාර්ගය තාර දැමීමට පවතින බව පවසන ලදී. එමෙන්ම බුලත්ගම පොදු සුසාන භූමියේ

අඩුපාඩු ගොඩක් පවතින අතර මළ ගෙදරක අවසන් කටයුතු සිදු කල පසු එන පුද්ගලයින්ට අත් සෝදා ගැනීමට හෝ ජලය නෙමැති බවද එහි කැළේ වැවී ඇති බවද සෞඛ්‍ය අංශයේ කම්කරුවන් නොමැති බැවින් කර්මාන්ත අංශයේ සේවකයින් යොදවා හෝ එම කාර්ය ඉටු කරන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් සුසාන භූමිය අධීක්ෂණය කිරීම සඳහා සෑම මන්ත්‍රීවරයෙකුම යායුතු බවද තමන් පසුගිය කාල සීමාව තුළ නිතරම එහි අධීක්ෂණයට ගිය බවද එය මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්නන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇති බවද පවසන ලදී. එමෙන්ම සොහොන් ගෙය කඩා වැටී ඇති අතර සෑම දෙනාම මෙය අධීක්ෂණයට යා යුතු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභාව සතු අනෙකුත් සුසාන භූමිවල මෙම ගැටලුව නොමැති බවත් මෙය පිහිටි ස්ථානයේ ලොකු ගැටලුවක් පවතින බවත් මෙහි නිසි මුරකරුවෙකු යෙදවිය යුතු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙහි විශාල අඩුපාඩු තොගයක් පවතින අතර එම අඩුපාඩු කඩිනමින් සකස්කරන ලෙසද මෙම සුසාන භූමිය සඳහා බළන්ගොඩ නොවන පිටස්තර පුද්ගලයින් පවා පැමිණෙන ලද බවද එහි විශාල ලෙස වදුල තිබෙන බැවින් එහි පවතින අරලිය වැනි මල් ගස් වදුල නිසා මැරී ඇති බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

**07:04:01** ඕළුගංතොට පන්සල අසල සිට වීථි ලාම්පු නොමැති ස්ථානවල වීථි ලාම්පු සවිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඕලුගංතොට පන්සල අසළ සිට ජනපද පාර දක්වා වීථි පහන් සවිකර ඇතත් එහි විදුලි බල්බ පත්තු නොවන බැවින් මෙම විදුලි බල්බ යොදා යථා තත්ත්වයට පත් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

**07:05:01.** බළන්ගොඩ ෆලීල් හාජ්ජියාර් මාවත ආරම්භක කොටස අළුත්වැඩියා කිරීම.

**07:05:02.** බළන්ගොඩ මිරිස්වත්ත සුබයිර් අලීම් මාවත ආරම්භක කොටස ප්‍රතිසංස්කරණය.

**(මෙම යෝජනා දෙකම මාර්තු මස කර්මාන්ත අංශයෙන් සිදුකරන නඩත්තු සඳහා යෝජනා කර ඇත.)**

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

**07:06:01.** බාන්ස් රත්වත්ත මාවතේ ඊ.එල් .ප්‍රනාන්දු මහතාගේ නිවස අසලින් සේනක පෙදෙසට සම්බන්ධ කළ මාර්ගය මැද ඇති සපු ගස සහ පොල් ගස් ඉවත් කර මාර්ගය සංවර්ධනය කිරීම.

**07:06:02.** කල්තොට පාරෙන් හැරෙන ඇකඩමිය මාර්ගයේ හරස් පාර නඩත්තු කර සංවර්ධනය.

**07:06:03.** හුණුකුඹුර මාර්ගයේ හංදිය පිළිසකර කර පාලම දක්වා නඩත්තු කිරීම.

**07:06:04.** සේනක පෙදෙසේ මුස්ලිම් ජනතාව වෙසෙන ස්ථානයේ නිවෙස් 03ක් ජනෙල් මට්ටම දක්වා පස්වලින් යට වී ඇති අතර එම පස් ඉවත් කරදීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජනා කඩිනමින් ඉටු කර දෙන ලෙස පවසන ලදී. එමෙනම් හුණුකුඹුර මාර්ගයේ ජල නල එලීමෙන් අනතුරුව ජල සම්පත් මණ්ඩලය විසින් එම මාර්ගය නිසි ලෙස සකස් කර නොමැති බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:07:01** උඩකන්ද පාර විශාල වලවල් සෑදී ඇති බැවින් ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීම.

**07:07:02** චාමර ගෙස්ට් පාර සහ නගර සභාව ඉදිරිපිට කරව්කැටිය පාර ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීම.

**07:07:03 බ**ළන්ගොඩ උඩකන්ද හංදියේ විදුලි බුබුල ගලවා ඇති බැවින් ඒ පිළිබඳ සොයා බැලීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින්, තමන් 06:07:01 යෝජනාව පිළිබඳ ගරු සභාවේ කිහිපවරක් සාකච්ඡා කළ අතර මේ පිළිබඳව කඩිනමින් විසඳුමක් ලබා දෙන පවසන ලදී. එමෙන්ම ඉතිරි යෝජනා දෙකද කඩිනමින් ඉටු කර දෙන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින්, උඩකන්ද මාර්ගය ඉතා පටු මාර්ගයක් බැවින් එය පිළිසකර නොකිරීමෙන් වාහන රියදුරන් මහත් අපහසුතාවයට පත්වන බව පවසන ලදී. බළන්ගොඩ නගර සීමාව තුළ රාත්‍රී කාලයේදී සිදුවන බොහෝ හොර මැරකම් නතර කිරීමට විදුලි බුබුලු දැමීමෙන් හැකිවන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ08 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

**07ඃ08ඃ01** බළන්ගොඩ හුණුකුඹුර කෝපිවත්ත පාර එච්.ඒ.කාන්තිලතා මහත්මිය වෙත ජලය ලබාගැනීම සඳහා මාර්ග පළුදු ගාස්තු නිදහස් කර ගැනීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ09 කර්මාන්ත කමිටුවට ලිපි මඟින් ලැබී තිබූ යෝජනා සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

01. බළන්ගොඩ ආනන්ද මෛත්‍රිය ජාතික පාසලේ ක්‍රීඩා පිටිය පිරිසිදු කිරීම සඳහා බැකෝ යන්ත්‍රය ලබාදීම.
02. කේ.සුමිත් රෝහිත අමරදාස මහතා විසින් දොරවෙල මැද පාරේ කාණු පද්ධතිය වල් බිහිවීමෙන් අවහිර වී ඇති බැවින් එය පවිත්‍ර කරදෙන ලෙස කළ ඉල්ලීම.
03. කෝපිවත්ත මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම සඳහා බී.සෝමසිරි මහතා කළ ඉල්ලීම. ඒ අනුව රු.69,525.00ක ඇස්තමේන්තුවක් සකස් කර ඇත.

ඉහත යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**08. මන්ත්‍රී යෝජනා**

**08ඃ01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08ඃ01ඃ01 ඇල්ලෙපොල සරස්වතී පාර කාපට් අතුරා සංවර්ධනය කිරීමේදී වසර ගණනාවක් පැරණි වැසි ජලය බැස යන බෝක්කුවක් වසා දමා ඇත. එම නිසා වැසිදින වලදී එම මාර්ගය සම්පූර්ණයෙන් ජලයෙන් යට වී ජනතාව අපහසුතාවයට පත් වේ. වැසි ජලය මාර්ගය හරහා ගලා ගොස් නිවාස තුළට වැසි ජලය ගලා යයි. විශාල මුදලක් වැයකර සංවර්ධනය කළ මාර්ගය සෝදා පාලුවට ලක් වේ. මේ පිළිබඳව ඉක්මනින් සොයා බලා එම බෝක්කුව නැවත පෙර තිබූ ආකාරයට ජලය බැස යාමට හැකිවන සේ සැකසීම.

08ඃ01ඃ02 බළන්ගොඩ නගර සභා සීමාව පුලුල් කිරීම.

08඿01඿03 බළන්ගොඩ නගර සභා සීමාවට අයත් මෙතෙක් වරිපනම් අය නොකරන දේපල සඳහා කඩිනමින් වරිපනම් බදු අය කිරීමට වැඩ පිළිවෙලක් සැකසීම සහ එම දේපල ලේඛන ගත කිරීම.

08඿01඿04 බළන්ගොඩ විද්‍යාලෝක මහ විද්‍යාලය පිහිටා ඇති එම භූමියෙන් ඉවත් කර ඉඩකඩ ඇති වෙනත් ස්ථානයකට ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ගරු සභාවට යෝජනා කරමි. ඉන්පසු එම තීන්දුව පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම.

08඿01඿05 බළන්ගොඩ නගර සීමාවේ පිහිටා ඇති නගර සභාව සතු ඉඩම් සියල්ල හඳුනාගෙන එම ඉඩම් මැන වෙන් කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, 07඿01඿01 යෝජනාව පිළිබඳ ප්‍රදේශවාසීන් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට ලිපියකින් දැනුම් දුන් බවද එතුමා විසින් මේ පිළිබඳව සභාවේ දැනුවත් කරන ලෙස තමන්ට පැවසූ බවද පවසන ලදී.

මේ පිළිබඳව වැඩ අධිකාරිතුමාගෙන් කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමරාච්චි මැතිතුමා විසින්, නගර සීමාවේ පහසුකම් භුක්ති විඳින නගර සභා ඡන්දය ඇති නමුත් නගර සභාවට වරිපනම් අය නොකරන නිවාස සෑම කොට්ඨාශකම පවතින බැවින් එම නිවාස වලින් වරිපනම් අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙසද විද්‍යාලෝක මහ විද්‍යාලය ඉතා සීඝ්‍රයෙන් දියුණු වන පාසලක් වන බැවින් එය කිරිමැටිතැන්න ප්‍රදේශයේ අක්කර 25 ක පමණ ඉඩමකට ගෙන යාමට සාකච්ඡා කර ඇති බැවින් මේ පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමන් දැනුවත් කරන ලෙස පවසන ලදී. එමෙන්ම නගර සභාව සතු ඉඩම් හඳුනාගෙන එම ඉඩම් මැන වෙන් කිරීම සුදුසු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින්, 2006 වර්ෂයේදී නගර සභා සීමාව පුලුල් වීම තුළ නගර සභාවට අයත්විය යුතු බොහෝ ඉඩම් නගර සභා සීමාවට නොමැති බවද එබැවින් මන්ත්‍රීවරුන් 17 දෙනා එකතු වී නගර සභා සීමාව පුලුල් කිරීම ක්‍රමවත් සේ සිදු කිරීම සුදුසු බවද පවසන ලදී. එමෙන්ම විද්‍යාලෝක මහ විද්‍යාලය පිළිබඳ වැදගත් යෝජනාවක් ගෙනවිත්

ඇති බවද මෙම පාසල විශාල වශයෙන් දියුණු බව අතර දරුවන් ප්‍රමාණයද විශාල වශයෙන් වැඩි වී ඇති බවද මෙය කාලෝචිත යෝජනාවක් බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08ඃ02 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08ඃ02ඃ01 නගරයේ රාත්‍රී කාලයේ හයර් දුවන ත්‍රීරෝද රථ හඳුනාගෙන නියාමනය කර සලකුණක් ලබාදී අද පවතින සොරසතුරු බියට යම් පිළියමක් ලබාදීම. (රථවාහන කමිටුවේදී සාකච්ඡා කරන ලදී.)

08ඃ02ඃ02 බලගහමුල හෝරාස්ථම්භය ප්‍රදේශයේ මතු වී තිබෙන Parking ප්‍රශ්නයට විසඳුමක් ලබාදීම.

08ඃ02ඃ03 නගරයේ පමණක් නොව සෑම ප්‍රදේශයකම මාර්ගයේ අයිනේ ඇති බාධකය වන කණු ක්‍රමයකට ස්ථාපනය කිරීම. ටෙලිකොම් කණු සහ ඩයලොග් කණු දෙක වෙන් වෙන්ව ඇති අතර එම වයර් එකම කණුවකට සම්බන්ධ කිරීමට උපදෙස් ලබාදීම.

08ඃ02ඃ04 නගරයේ ක්‍රීඩාංගණය සහ ගංගාව අසළ සහ සාලිය එල්ලාවල මාවත සහ ගංගාව අතර ඇති තීරයේ වසරේ සෑම දිනකම මල් පිපෙන මැයි මල් ගස් සහ රෙබොරෝසියා උස මල් ගස් අලංකාරය සඳහා සිටුවීම. (බළන්ගොඩ ජාතික පාසලේ පිවිසුමේ ඇති ආකාරයට)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් 07ඃ02ඃ01 යෝජනාව පිළිබඳ පොලිසිය දැනුවත් කරන ලෙසද තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉතිරි යෝජනා සියල්ල කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසද පවසන ලදී. යාබද ඉඩම සුද්ධ කළ අතර පොරොත්තු බස් එම ස්ථානයට යොමු කර දැනට එම බස් ඇති ස්ථානය රථ වාහන නැවතුම් ස්ථානය ලෙස භාවිතා කළ හැකි බවද පවසන ලදී. සභාපතිතුමා නිවැරදි දේ ඉටු කරන්නේනම් සභාපතිතුමාට සහය ලබා දෙන බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08ඃ03 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

08ඃ03ඃ01 මහජන පොළ ආපන ශාලාව ජනවාරි,පෙබරවාරි කොවිඩ් 19 නිසා පොළට එන පාරිභෝගිකයින් හා වෙළෙඳුන් අඩුවීම නිසා විවෘත කළ නොහැකි නිසා එම මාස දෙකේ කුලිය අය නොකර දෙන මෙන් ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | 24,342,111.89 |
| **වෙනත් ලැබීම්** | 4,643,380.02 |
| **මුලු ලැබීම්** | 28,985,491.91 |
| **පුනරාවර්ථන වියදම්** | 8,430,563.98 |
| **වෙනත් වියදම්** | 6,770,980.00 |
| **මුලු වියදම්** | 15,201,551.98 |

2021-03-01 දින සිට 2021-03-31 දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 56-1906 | 17,888.00 |
| 37-7933 | 7,976.80 |
| 227-5020 | 37,382.80 |
| RD-8240 | 33,268.64 |
| | 10,000.00 |
| 226-7521 | 17,056.00 |
| BC-0005 | 31,200.00 |
| GC 0001 | 7,946.00 |
| HF - 8558 | 9,464.00 |
| GK-6227 | 16,640.00 |
| JD-4684 | 2,507.10 |
| LL-2110 | 4,132.00 |
| ND-5124 | 24,053.12 |
| PF-4006 | 27,588.00 |
| QL-2901 | 3,288.00 |
| RC-1107 | 26,720.24 |
| OV/M 0017 | 9,795.00 |
| RB-4786 | 12,958.40 |
| RD-8000 | 10,124.40 |
| ZA-5039 | 10,124.40 |
| UQ - 1933 | 712.40 |

| | |
|---|---|
| DDR0008 | 936.00 |
| ZA-0228 | 2,593.76 |
| ZA-9835 | 22,880.00 |
| VI - 1833 | 1,328.90 |
| **එකතුව** | **348,563.96** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් තමන් බළන්ගොඩ නගර සභාවේ සභාපති ලෙස දින 45 ක් වැඩ කළ සමයේදී තමන්ට පක්ෂ භේදයෙන් තොරව මෙම සභාව නියෝජනය කරන පක්ෂ හතරෙහි මහජන නියෝජිතයින් සහයෝගය ලබා දුන් බවද කුහකකම ඊර්ෂ්‍යාව නොමැතිව හදවතින්ම සුභ පැතුම් එක් කළ බවද මන්ත්‍රීවරුන් 16 ක් සභාවේ සිටි අතර ඉන් 14 දෙනෙකුම තමන්ට උපරිම සහයෝගය ලබා දුන් බවද ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන සියලුම මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාට තම ස්තුතිය පුද කරන බව ද පැවසීය. එමෙන්ම නගර සභාවේ ලේකම්තුමිය අංශ ප්‍රධානීන් හා කාර්ය මණ්ඩලයේ නිළධාරීන් තමන්ට උපරිම සහයෝගය ලබා දුන් බවද තමන් පක්ෂ භේදයකින් තොරව ජාති භේදයකින් තොරව වැඩ බලන සභාපති ලෙස දින 45 ක් නීත්‍යානුකූලව හා අවංකව මහජනතාව වෙනුවෙන් සේවය කළ බවද තමන් නීතිවිරෝධී කිසිඳු කටයුත්තක් නොකළ බවට 100%ක් විශ්වාස බවද එසේ නීති විරෝධී කටයුත්තක් තමන් කර ඇත්නම් පෙන්වා දෙන ලෙසද එසේ වුවහොත් තමන් තම මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වන බවද පවසන ලදී.

එමෙන්ම තමන් නගර සභා ආඥා පනතට අනුකූලව නිළධාරීන් සමඟ ඉතා සුහදව හා මිත්‍රශීලීව කටයුතු කළ අතර, එදිනෙදා වැඩ කටයුතු එදිනෙදා අවසන් කළ බවද තමන්ට බළන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයෙකු වීමට, උප සභාපති වීමට හා සභාපති වීමට අධිෂ්ඨානයක් තිබූ බවද තමාට හොඳ නායකත්වයක් බළන්ගොඩ සංවර්ධනයේ නියමුවා වන හිටපු නගර සභා සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමාගෙන් ලැබුණු බව ද පවසන ලදී. එතුමා තමන්ව සෑම ස්ථානයකටම කැටුව ගිය අතර සෑම රජයේ නිළධාරියෙක්ම හඳුන්වා දුන් බවද එබැවින් එතුමාට තම ස්තුතිය පුද කරන බව ද පැවසීය. බළන්ගොඩ නගර සභාව යනු දක්ෂ, ක්‍රියාකාරී, කීර්තිනාමයක් දිනාගත් අයතනයක් වන අතර බළන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු, උප සභාපතිවරයෙකු හා සභාපතිවරයෙකු සඳහා ලංකාවේ ගෞරවයක් තිබෙන අතර තමන්ට සුභ පැතුම් එක් කළ ජනතාව මඟින් එය සනාථ වන බවද පැවසූ ගරු උප සභාපතිතුමා, තමන්ට සතුටු විය හැකි කාරණා දෙකක් පවතින බවත්, එම කාරණා දෙක වන්නේ දේශලපාලඥයෙක් වශයෙන් කටයුතු කිරීම හා රජයේ

නිළධාරියෙක් වශයෙන් කටයුතු කිරීම බව සඳහන් කළේය. එමෙන්ම අවුරුදු 30ක් රජයේ නිළධාරියෙකු ලෙස සේවය කර අනතුරුව රජයේ නිළධාරින් සමඟ කටයුතු කිරීමට දේශපාලන නායකත්වය ලබා දීම සුවිශේෂී බවද තමන්ට රජයේ නිළධාරීන් තේරුම් ගත හැකි අතර රජයේ නිළධාරීන්ට තමන්ව තේරුම් ගැනීමට හැකි වූ බව ද එබැවින් තමන්ට මහජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කිරීමට හැකි වූ බවද පවසන ලදී. ඒ සෑම අවස්ථාවකදීම තමාට අවශ්‍ය මඟපෙන්වීම හා ආශිර්වාදය ලබාදුන් බළන්ගොඩ පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රධාන සංවිධායක රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමාට හා කාර්ය මණ්ඩලයට ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ බළන්ගොඩ ආසන සංවිධායක භාණු මුණිප්‍රිය මැතිතුමාටද තම ස්තුතිය පුද කරන ලදී. එමෙන්ම චමික ජයමිණි විමලසේන ගරු සභාපතිතුමා සමඟ එකට නඩුවට ගොස් එකට තේ බිව් බවද දේශපාලනික වශයෙන් මත භේද තිබුණද තම මිත්‍රත්වය එලෙසම පැවතිය බවද එතුමා තමන්ට බලපෑම් නොකල අතර තමන්ගේ දේශපාලන ගමන සාර්ථකව කරගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් බව ද සියලුම මන්ත්‍රීවරුන්ට මෙන්ම ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට තම ස්තුතිය පුද කරනබව ද පැවසීය.

එමෙන්ම කුහකයින්ට කෙදිනකවත් ජයග්‍රහණයක් ලැබීමෙන් සතුටු වීමට නොහැකි අතර මන්ත්‍රීවරුන් 16 දෙනාගෙන් මන්ත්‍රීවරු 14 දෙනෙක් තමන්ට සුභ පැතුම් එක් කළ අතර, අඩුපාඩු පෙන්වා දෙමින් අවශ්‍ය සංවර්ධනයන් ඉල්ලූ බවද හදවත පිරිසිදු නොමැති කෙනාට ඉදිරියට යාමට දෙවියන් වහන්සේ පවා ඉඩ ලබා නොදෙන බව මෙම සභාව තුළ ඔප්පු කර පෙන්වා ඇති බවද පැවසූ ගරු උප සභාපතිතුමා තමන් නියෝජනය කළ කොට්ඨාසය දිනූ පුද්ගලයාට වඩා පරාද වූ තමන් මන්ත්‍රී බවට පත් ව අනතුරුව උප සභාපති මෙන්ම සභාපති වූ බව ද එය තමන් කරන හොඳ දේ අනුව සිදු වන අතර කුහකයින්ට කවදාවත් ඉදිරියට යා නොහැකි වනවා සේම දෙවියන් වහන්සේගේ ශාපය ලැබෙන බවද සඳහන් කළේය. එමෙන්ම කාට වුවද සභාපති පුටුවේ වාඩිවීමට වාසනාවක් මෙන්ම ලැබීමක් තිබිය යුතු අතර, තමන් බළන්ගොඩ සියලුම ස්වාමීන් වහන්සේලා, පූජකවරුන්ගේ හා ආයතනවල ආශිර්වාදය ලබා ගෙන කළ කටයුතු කළ බවද තමන් සිටි කාලය තුළ සියලු දෙනාම තමන්ට ආශිර්වාද හා උදව් උපකාර කළ බැවින් ඒ වෙනුවෙන් තම ස්තුතිය පුද කරන බව ද පැවසීය.

ගරු උප සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පැවසූයේ 2015 වර්ෂයේ දී හා 2017 වර්ෂයේ දී බළන්ගොඩ නගර සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ලංකාවේ ප්‍රථම ස්ථානය ලැබූ කාලය තුළ බළන්ගොඩ නගර සභාවේ මහජන නියෝජිතයින් නොසිටි අතර, නැවත 2018 වර්ෂයේදී ද ප්‍රථම ස්ථානය ලැබූ බවද ඊට හේතුව වන්නේ දක්ෂ නිළධාරී කණ්ඩායමක් නගර සභාවේ සිටීම වන අතර සම්මාන ලබා දෙන අවස්ථාවට තමන්ට සහභාගී වීමට ලැබීම පිළිබඳ සතුටු වන බවද ඇතැමුන් සභාපති පැමිණ එක් මසකින් මෙම සම්මානය ලබා ගත් බව පැවසූ නමුත් මාසයකින් නොව දක්ෂ නිළධාරී කණ්ඩායම සමඟ දේශපාලන අධිකාරිය එක්ව එකට යා හැකිනම් සෑම දේම සාර්ථක වන බවද පවසන ලදී.

එමෙන්ම දෙහිගස්තලාව කොට්ඨාසයේ සියලුම මාර්ග කාපට් කිරීම සඳහා ව්‍යාපෘතියක් නම් කර ඇති බැවින් තමන් ඒ පිළිබඳව සතුටු වන බවද දුනුමඬලගහවත්ත මාර්ගය හා බෙතෙල් හිල් මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ බවද කුමාරගම මාර්ගයේ මිනුම් අවසන් බවද අවුරුදු 26 ක්

බළන්ගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොමැතිව සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලැබීමේ වටිනාකම සමඟ විශාල වැඩ කොටසක් ඉටු කිරීමට හැකි වූ බවද මේ සම්බන්ධව ගරු ජනධිපතිතුමා, ගරු අගමැතිතුමා හා බැසිල් රාජපක්ෂ මැතිතුමාට මෙන්ම අකිල එල්ලාවල මැතිතුමාට ද ස්තුතිය පුද කරන බව පැවසීය. මෙම සභාවට තව වසරක පමණ කාලයක් ඇති බවද පළාත් සභා මැතිවරණයට පෙර පළාත් පාලන මැතිවරණයක් පවත්වන බවද සඳහන් කරමින් හා නැවතත් සියලු දෙනාට ස්තුතිය පුද කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් අතුරු මාර්ගවල දැන්වීම් පුවරු සවි කිරීම පිළිබඳ සාකච්ඡා කර ඇති බැවින් එහි වර්තමාන තත්ත්වය කුමක්දැයි විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මොබිටෙල් ආයතනය සමඟ සාකච්ඡා කළ අතර ඔවුන් මේ සඳහා අනුග්‍රහය දැක්වීමට කැමති වූ බැවින් ඉදිරියේදී මෙය ඉටු කිරීමට හැකි බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය**

මුගුණමලය ප්‍රදේශයේ දඹගහ නිවස අඹ ගස කපා ඉවත් කර දෙන ලෙස පසුගිය කාල සීමාව තුළදීම සභාවේ කථා කළ බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය, එය කඩිනමින් ඉවත් කර දෙන ලෙසද කුඹුරු ඉඩම් ගොඩ කර වැටවල් ගසා, කාණු කපා කිසිඳු ගැටලුවක් නොමැති තත්ත්වයට නගර සභාව පත් කර ඇති බවද හිටපු වැඩ අධිකාරිතුමාගේ කාලයේදී මුගුණමලේ නිවසක බැම්මක් පාරට සමීපව ඉදි කිරීමට අවසර දී තිබෙන අතර මෙමගින් විශාල අනතුරක් සිදු වීමට හැකි බැවින් මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙසද පවසන ලදී. එමෙන්ම බළන්ගොඩ නගර සභාවේ සංරක්ෂිත කලාපයක් ලෙස මුගුණමලේ ප්‍රදේශය නම් කර ඇතත් නගර සභාවෙන් බිම් කට්ටි සැලසුම අනුමත කිරීමට ගන්නා අයදුම්පතේ ඒ බව සඳහන්ව නොමැති බවත්, මෙය වෙනස් කළ යුතු අතර මේ පිළිබඳ ජනතාව දැනුවත් කරන ලෙසත් මෙම කලාපය තුළ කඩ ඉදිකිරීමට නොහැකි නමුත් නිවාස ඉදිකරන බවට අනුමැතිය ලබා ගෙන කඩ කාමර ඉදි කරන බැවින් මෙය නියමිත පරිදි  වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසත්, මෙය ප්‍රාදේශිය සංවර්ධන කමිටුවට හෝ දිස්ත්‍රික් කමිටුවට හෝ යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත් පවසන ලදී.

මේ පිළිබඳ වැඩ අධිකාරිතුමාගෙන් කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

කොවිඩ් 19 රෝගයෙන් මිය යන රෝගීන් ආදාහනය කරනවාද භූමිදානය කරනවාද යන්න පිළිබඳ විශාල ගැටලුවක් මුස්ලිම් ජනතාවට තිබූ අතර භූමිදානය සඳහා අවසර ලබා දීම ගැන ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ඇතුළු මහා ආණ්ඩුවට ස්තුතිය පළ කරන බව ද තමා මෙය සභාවේදී කථා කළ අවස්ථාවේදී මුස්ලිම් ප්‍රජාවට සහයෝගය ලබා දීම පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමාට හා ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමාට විශේෂ ස්තුතිය පළ කරන බව ද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, 2015 සිට 2020 වර්ෂය වනතෙක් තම ආණ්ඩුව පැවති සමයේ බළන්ගොඩ නගරයට හැකි තරම් වැඩ කොටසක් කළ බවත්, විශේෂයෙන් වසර 26 ක් ගත වනතුරු සංවර්ධනය නොකරන ලද ෆලීල් හාජ්ජියාර් මාවත සංවර්ධනය කිරීමට හැකි වූ අතර එහි වටිනාකම ලක්ෂ 20 ක් බවද නගර සභා සීමාව තුළ බොහෝ මාර්ග කොන්ක්‍රීට් කළ බවද 2020 න් පසුව මෙම ආණ්ඩුව මඟිනුත් නගරයේ ඉතිරි සංවර්ධන කටයුතු කරගෙන යාම පිළිබඳ සතුටු වන අතර ඒ පිළිබඳව ස්තුතිය පළ කරන ලදී.

එමෙන්ම සභාව තුළදී සුබයිර් ආලීම් මාවත හා මුස්තාපා මාවත පිළිබඳ කථා කළ නමුත් සභාවේ මුදල් නොමැති කමින් එය ඉටු කිරීමට නොහැකි වූ නමුත්, සුබයිර් ආලීම් මාවත, දුනුමඩලගහවත්ත මාර්ගය හා බෙතෙල්හිල් මාවත සංවර්ධනය කිරීම ගැන සතුටු වන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා තමන් පිළිබඳ වැඩි විස්තර ප්‍රකාශ නොකරන ලද බව ද තම පවුලට විශේෂ දේශපාලනික පසුබිමක් පවතින අතර තමන් අබුසාලි මැතිතුමා හා සී.එම්.මරික්කාර් මැතිතුමාගේ පරම්පරාවෙන් පැවත එන මිනිසුන් බවද බළන්ගොඩ ඉතිහාසය තුළ විශාල වශයෙන් ඉඩම් තිබුණේ තම පවුලට බවද පැවසීය. එමෙන්ම තමන් ගුරුවරයෙකු ලෙස සේවය කළ අතර තනතුරුවලට කෑදරකමක් නොමැති බවට ගරු සභාපතිතුමා හා විමලසේන මැතිතුමා ඒ සඳහා සාක්ෂි බවද තලතා අතුකෝරළ මැතිතුමිය හමුවේ සභාපතිකම ගරු සභාපතිතුමාට භාරදුන් අතර තමන් තනතුරු බලාපොරොත්තුවන පුද්ගලයෙක් නොවන බවද බළන්ගොඩ මුස්ලිම් ජනතාව තමා කවුරුන්දැයි දන්නා බවද සී.එල්.එම් මරික්කාර් තම සීයා වන අතර ඒ.එල්.එම්.අබුසාලි මැතිතුමා තම බාප්පා බවද එම පරම්පරාවෙන් පැවත එන පුද්ගලයෙකු වශයෙන් කිසිවෙකුගෙන් වචනයක් හෝ ඇසිය යුතු නොවන බවද තනතුරක් ලැබුණා කියා ඔලුව උදුම්මා ගෙන දඟලන්නේ නැති බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසූවේ තමන් දේශපාලන ඉතිහාසයේ කවදාකවත් කිසිඳු පුද්ගලයෙකුගෙන් රුපියලක් හෝ ඉල්ලා ඇත්නම් එය ඔප්පු කරන ලෙසත් එවිට මෙම තනතුර අත්හැර යන බවත් අබුසාලි මැතිතුමා තමන්ව මෙම ස්ථානයට රැගෙන ආ අතර එතුමා විසින් කියා දී තිබෙන්නේ කිසිවෙකුගෙන් රුපියලක් හෝ නොගන්නා ලෙස බවත් ය. එමෙන්ම තමන් කිසිවෙකුට දොස් නොකියන අතර එය ආඩම්බරයක් කර නොගන්නා බවද මීළඟ මැතිවරණයේදී මහජන ඡන්දය නොලැබුණහොත් මේ සේරම අවසන් වන බවද පවසන ලදී. කාට හෝ මගේ කථාවෙන් වැරැද්දක් හෝ හිත රිදීමක් සිදු වූයේ නම් සමාවන ලෙසද දේශපාලනයෙන් කිසි දිනක හම්බ කර කා නොමැති බවද දේශපාලන ව්‍යාපාරයක් ලෙස කිසි දිනෙක සිදු කර නොමැති බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් දින 48 ක කාලයකට වැඩ බලන සභාපති ලෙස පත්වූ ගරු උප සභාපති එම්.එම්.රූමි මැතිතුමා එම කාලය තුළ තමන්ට සහයෝගය ලබා දීම පිළිබඳ ස්තුතිය පළ කරන බවත්, බළන්ගොඩ නගරයේ බොහෝ කඩවල්වල බඩු භාණ්ඩ කඩ කාමරවලින් පිටතට දමා ඇති බැවින් මාර්ගයේ ගමන් කරන අය අපහසුතාවයට පත්වන අතර එය අශෝබන දර්ශනයක් බවත් මේ පිළිබඳ අදාළ කඩහිමියන් දැනුවත් කරන ලෙසත් පවසන ලදී.

එමෙන්ම කොවිඩ් 19 වසංගතයේ බලපෑම බළන්ගොඩ නගරයටද විශාල වශයෙන් බලපා ඇති අතර, කෝපිවත්ත, සුදර්ශනගම, ආනන්ද මෛත්‍රීය මාවතේ බොහෝ පිරිසකට කොවිඩ් 19 රෝගය වැළදී ඇති බැවින් එම ප්‍රදේශවලට පමණක් නොව බළන්ගොඩ නගරයේ සෑම ප්‍රදේශයකම එවැනි අයට සහනදායි බඩු මල්ලක් නගර සභාව හරහා ලබා දිය නොහැකිදැයි විමසන ලදී.

මීට අමතරව හුණු කුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ කාපට් ව්‍යාපෘතිය ඉටු කිරීමට නියමිත බැවින් මල් ශාලාව අසළ ඇති පාලමේ අත් ඇඳි දෙක සභාව මගින් ඉවත් කර දෙන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් ඊයේ දින එනම් මාර්තු මස 08 වන දින කාන්තා දිනය යෙදී තිබුණු අතර කාන්තාවක් ලෙස තමන්ට ශක්තිමත්ව මෙම ස්ථානයේ සිටීමට හැකියාව ලැබී ඇත්තේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිසා බැවින් එතුමාටද තම නායකතුමිය වන තලතා අතුකෝරළ මැතිතුමියටද ස්තුතිය පළ කරන ලදී. අද වන විට පිරිමින්ට වඩා ඉදිරියෙන් කාන්තාවන් සිටින අතර, සෑම ආයතනයකම ඉහළින්ම සිටින්නේ කාන්තාවන් බවද රට තුළ අගමැතිකම්, ජනාධිපතිකම් දැරීමට පවා කාන්තාවන්ට හැකියාවක් ලැබී ඇති බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය එක් දිනක් පමණක් කාන්තා දිනය නොවන අතර ඉතිරි සියලුම දිනද කාන්තාවන්ගේ දින බව ද කාන්තාවන් පවුලේ බර කරට ගෙන ජීවත් වන බැවින් කාන්තාවන්ට ඉදිරියෙන් ඉදිරියට යාමට ශක්තිය ලැබේවායි පතන ලදී.

දින කිහිපයකට පෙර මහජන බැංකුව අසළ බස්නැවතුම්පල ආශ්‍රිතව ඉතා අලංකාරවත් ලෙස බිතු සිතුවම් නිර්මාණය කර විවෘත කළ අතර එහි අලංකාරය තවත් වැඩි වීම පිණිස එම ස්ථානයේ ඇති මගී නැවතුම්පල පිළිසකර කර තීන්ත ආලේප කරන ලෙස ද පසුගිය ආණ්ඩුව සමයේදී ගම්පෙරළිය වැඩ සටහන යටතේ බොහෝ වැඩ කොටසක් කළ අතර පන්සල්, පල්ලි හා කෝවිල් වලට මුදල් වෙන්කල බවද හැකි ඉක්මනින් උඩකන්ද පාර සකස් කරන ලෙස ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නව බස්නැවතුම්පල නව පදික කඩ තිහක්ද තිස් එකක්ද පවතින්නේ යනුවෙන් විමසන ලදුව කඩ තිස් එකක් බදු දී ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී. මහජන පොල වැසිකිළිය පිළිසකර කර දෙන ලෙසද පදික කඩ තිස් එකේ දැමූ ෆ්ලැස් ලයිට් පත්තු නොවන බැවින් ඒ සඳහා බල්බ් යොදන ලෙසද පැවසූ අතර, මහජන පොළ කඩ 20 සඳහා විදුලිය ලබාදීමට හැකියාවක් ඇත් දැයි විමසන ලදී. එමෙන්ම ඉතිරි කඩ 16 ටෙන්ඩර් ක්‍රමයට හෝ ලබා දිය හැකිදැයි විමසූ අතර, RDB බැංකුවේ ඉඩම වල් බිහි වී ඇති බැවින් එය ශුද්ධ කරන ලෙසත්, අදාළ ආයතනය දැනුවත් කරන ලෙසත් පවසන ලදී.

මීට අමතරව මහජන බැංකුව අසළ ඉදිකරන බිතු කැටයම ඉදිකිරීම හොඳ වැඩක් බවත් එහි ප්‍රදර්ශන පුවරුවේ ගරු සභාපතිතුමාගේ සංකල්පයක් මත අකිල එල්ලාවල මැතිතුමා අතින් විවෘත කරන ලද බව සටහන් කර තිබූ නමුත් එම බැම්ම සකස් කිරීමේ සංකල්පය තමා ගෙන ආ යෝජනාවක් බවත් මෙම සිද්ධියට තමාගේ හිතට සතුටුයි මෙන්ම දුකයි යනුවෙන් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් පැවසීමට විශේෂ දෙයක් නොමැති අතර නඩුව පවතින බැවින් කට පරිස්සම් කරගෙන සිටිය යුතු බවද පසුගිය දින 48 තුල වැඩ ආවරණය කරන ලද ගරු සභාපතිතුමා සභාවල් දෙකක් මෙහෙයවූ අතර එහිදී කාල කළමනාකරණය ඉතා සතුටුදායක ලෙස පැවති බවද සභාවේ කාලය අනවශ්‍ය ලෙස මිඩංගු කරන බැවින් එම්. ටී. එම්. රුමී මැතිතුමා සභාපති ධූරය කළ කාල සීමාවේ නිසි ලෙස කාලය කළමනාකරණය කළා සේම පරිණත සභාපතිවරයෙකු ලෙස කටයුතු කළ බවද පක්ෂ භේදයකින් තොරව සියලු මන්ත්‍රීවරුන්ට එක සේ සැලකූ බවට තමන් විශ්වාස කරන බවද පැවසීය. එමෙන්ම මෙම සභාවේ මුස්ලිම් මන්ත්‍රීවරුන් දෙදෙනෙකු නියෝජනය කරන අතර ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා කොවිඩ් 19 රෝගයෙන් මියයන මුස්ලිම් පුද්ගලයින් ආදාහනය කිරීමට අවසර ලබා දීම පිළිබඳ ගරු ජනාධිපතිතුමාට අගමැතිතුමාට හා තම රජයට ස්තුති කළ බවද කවුරු වුවත් මොන ජාතියක ආගමක කුලයක සිටියද තමන් දන්නා ආගම අනුව මරණය ආසන්න වන විට එය පෙනෙන අතර සමහරුන්ට තමන් යන තැන පෙනෙන බවද සමහර ආගම්වල පෙර භවය ගැන කියවෙන නමුත් සමහර ආගම්වල නැවත ඉපදීමක් ගැන විශ්වාස නොකරන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා ස්වාභාව ධර්මයට ආවේණික වන විදිහට පසට අනුගත වීම මගින් වන මරණය හොඳ බව එම ආගමෙන් කියවෙන නමුත් හරියට එම මරණය සිදු වුණේ නැත්නම් එසේ වන්නේ තමා කළ පාපය අනුව බව දෙවියන් වහන්සේ කියා තිබෙන බවද නිවැරදිව ආගමානුකූලව ජීවත්වූයේ නම් දෙවියන් වහන්සේලා තමන් කරන පින අනුව මරණය සිද්ධ විය යුතු බව තමන් දන්නා කුරාණය බවද මෙය භූමිදානයද ආදාහනයද යනුවෙන් නෙවෙයි දෙවියන් වහනසේගේ කැමැත්ත අනුව සිදු වූවානම් හරි මරණය ලැබිය යුතු බවද දෙවියන් වහන්සේගේ අකමැත්ත අනුව සිදු වූවානම් එය ආදාහනයද භූමදානයද යන්න ප්‍රශ්නයක් විය නොහැකි බවද තමන් දන්නා පරිදි ආගමානුකූලව සිදුවන ආකාරය එය බවද පවසන ලදී.

එමෙන්ම ඡන්දය ඉල්ලන විට දේශපාලනඥයෝ කරන කථා නොව ඡන්දයෙන් පසුව දේශපාලනඥයෝ ක්‍රියා කරන ආකාරය වෙනස් බව දැන් තමන්ට ද තේරී ඇති අතර ඇතැම් දේවල් වෙනස් ආකාරයට සිදුවන විට තමාට කල කිරීම් ඇති වන බව ද තම ආණ්ඩුව යටතේ නගර සභාවේ සිදුවන සංවර්ධන කටයුතු සඳහා සභාව තිබුණා හෝ නොතිබුණා අවශ්‍ය කටයුතු කරන බවද පසුගිය කාලයේ වූ සිදුවීම් සමග ආතල් එකක් ගත් අතර සභාපතිවරු ඉදිරිපත් වූ බවද සභාපතිවරුන්ගේ නම් යෝජනා වූ බවද තමන්ගෙන් විමසූ අවස්ථාවලදී තමන් එදා ඉල්ලුවෙත් නෑ අද ඉල්ලන්නෙත් නෑ යනුවෙන් පැවසූ බවද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් සභාව ලබා ගෙන කටයුතු කිරීමට තම කණ්ඩායම බලාපොරොත්තු වූ බවද ගරු සභාපතිතුමාගේ කටින්ම සභාපතිතුමා එන අන්තිම සභාව අද යැයි විවිධ සභාවලදී පවසමින් ඉදිරියට පැමිණෙන සභාපතිවරුන්ට සහයෝගය දෙන බව පැවසූ නමුත් ගරු සභාපතිතුමා කපටියෙක් බවද ඇතැම් අවස්ථාවලදී නඩුවට වාසිදායක වන ලෙස සභා වාර්තාව සකස් කරන බවට තමන්ට ඇතැම් අවස්ථාවලදී සැක හිතෙන බවද ගරු සභාපතිතුමාගේ ඇතැම් දේවල් වලට හොඳ කියූ නමුත් ඇතැම් කාර්යයන් එදා සිටම තමන් විවේචනය කළ බවද පැවසීය.

එමෙන්ම අනවසර ඉදිකිරීම් සම්බන්ධව මන්ත්‍රීවරුන්ට නොකියා ඔවුන්ගේ වසමට ගොස් වැඩ කළ බැවින් තමන් ඒ ගැන කෑ ගැසූ බවද මෝටර් ග්‍රේඩරය , නව පදික කඩ, අනවසර ඉදිකිරීම් ඉවත් නොකිරීම පිළිබඳ කථා කළ අතර මහජන පොළේ අනවසර ඉදිකිරීමක් සිදුව ඇති නමුත් කවුරුත් එය ඉවත් නොකළ බවද ගරු සභාපතිතුමා පත් වූ දා සිට යැවූ ලිපිවලට කිසිඳු අනවසර ඉදිකිරීමක් ඉවත් කර නොමැති බවද අතුරු ව්‍යවස්ථාව අනුව සභාව පාලනය නොකිරීම වැරදි බව ද සඳහන් කළේය. හොඳ කළානම් හොඳ නොකියා සිටීමට තරම් කුහක නොවන බව ද එය නඩුවට වාසිද අවාසිද යන්න තමාට අදාළ නොවන බව ද සාක්ෂි දීමට අවශ්‍ය වුවහොත් සාක්ෂි දෙන අතර ගරු ආණ්ඩුකාරතුමා හා මන්ත්‍රීවරුන් 17 දෙනා ඉදිරියේදී ලේකම්තුමියගේ වැරදි පැවසූ බවද ටිකිරි මොළේ නොමැති වීම පිළිබඳ කණගාටු වන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු සභාපතිතුමාගේ අදහස් දැක්වීම.**

මෙම සභාවේ සභාපති ධූරයට තමන් බලෙන් නොපැමිණි අතර අනුන්ගේ බත් පතක් තමන් උදුරා නොගත් බවද එදා පැවති දේශපාලන වාතාවරණය මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය එක්ව පැවති රජයක් එම අවස්ථාවේදී පැවති බැවින් එම හවුල් රජය පැවති අවස්ථාවේදී පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින් සාකච්ඡා කරගත් තීරණ අනුව ක්‍රියා කළ බවද ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා තම නිවසට නිරන්තරයෙන් පැමිණි හා දුරකථනයෙන් සාකච්ඡා කළ අතර එම සෑම අවස්ථාවකදීම තමන්ට ඒ පිළිබඳව කිසිවක් ප්‍රකාශ කළ නොහැකි බව පැවසූ බවද තමන්ගේ නායකතුමිය තමන්ට ලබා දෙන උපදෙස් අනුව තමන් කටයුතු කළ බවද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා මතක් කළ පරිදි තලතා අතුකෝරල මැතිතුමිය සමඟ පැවති අවසන් සාකච්ඡාවේ දී ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අවශ්‍ය නොවන බැවින් එතුමාට පිටව යන ලෙස අමාත්‍යතුමිය පැවසූ බවද අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා හා තමන් සමඟ පැවති සාකච්ඡාවේදී ජ්‍යෙෂ්ඨත්වය අනුව

සභාපති තනතුරට සුදුසු පුද්ගලයා වන්නේ ඔහු බැවින් සභාපතිකම භාර ගන්නේද යන්න අමාත්‍යතුමිය විමසුව නමුත් ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අවංකව හා විශ්වාසදායක ලෙස ප්‍රකාශ කළේ සභාවේ පවතින තත්ත්වය මත මෙය කරගෙන යාමට සුදුසු වන්නේ චමික විමලසේන වන තමා බවයි. ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාගේ සභාපතිකම තමන්ට ලබා දුන් බවද අනතුරුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින්ගේ සාකච්ඡාවෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාට උප සභාපතිකම ලැබුණු බවද පවසන ලදී.

නමුත් පසුකාලීනව සිදු වූ දේශපාලන විපර්යාස නිසා නිරන්තරයෙන් මෙම සභාවේ ගැටලු ඇති වූ බවද හිටපු සභාපතිතුමා උප සභාපතිවීමට බලාපොරොත්තු වූ නමුත් එසේ නොවීම නිසා එතුමා සභාවේ නිරන්තරයෙන්ම ගැටලු ඇති කර ගත් බවද සභාවේ කලු පැල්ලමක් ඇති වන තරමට එම ගැටුම් දුරදිග ගිය බවද පසුගිය නොවැම්බර් මස සිටම විශාල ලෙස කඩාවැටීම් වලට ලක්වූ බවද එහිදී තමන් කේන්තියක් තරහක් ඇති කර නොගත් අතර මෙම ස්ථානයේ මොන ප්‍රශ්න මත ගැටුම් ඇති වුවද මෙය දේශපාලන ප්‍රශ්නයක් බවද පවසන ලදී. එමෙන්ම සභාවේ ඇතැම් අවස්ථාවලදී සභාවේ මන්ත්‍රීවරු විසින් ජනාධිපති අගමැති ආණ්ඩුකාරතුමා රජය තම පක්ෂයේ බැවින් මොන ප්‍රශ්නය පැමිණියද සභාවේ බලය ලබා ගන්නා බව පැවසූ බවද පවසන ලදී. නමුත් එය යුක්ති සහගතව නගර සභා ආඥා පනත අනුව වලංගු ප්‍රකාශයක් නොවන බවද ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සහ ජනතා ඡන්දයෙන් පත්ව ආ මන්ත්‍රීවරුන් විසින් දැනට මාස හතරක පමණ කාලයක් බළන්ගොඩ ජනතාව වෙනුවෙන් කිරීමට ඇති සංවර්ධන කටයුතු නවත්වා ඇති බවද ඒවා නැවතිමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කර ඇති බැවින් එහිදී තමන් කණගාටුවට පත්වන බවද පවසන ලදී.

එමෙන්ම ජනවාරි මාසය අවසන් වීමට පෙර ලහි ලහියේ වරිපනම් බදු එකතු කරනුයේ ජනතාව වෙනුවෙන් සංවර්ධන කටයුතු ඉටු කිරීමට බවද එසේ ඉටු කිරීමට සභාව බැඳී සිටින බවද පවසන ලදී. එම සියලුම කටයුතු අඩවන විට කඩා කප්පකල් කර ඇති අතර මෙම ප්‍රශ්නය දුරදිග ගොස් බොහොම අසාධාරණ ලෙස හා අයුක්ති සහගත ලෙස ජනවාරි මස 15 වන දින රාත්‍රියේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කිසිඳු චෝදනාවක් නොමැතිව ගැසට් පත්‍රයක් මගින් වැරැද්දක් චෝදනාවක් නොමැතිව තමන් සභාපති ධූරයෙන් ඉවත් කළ බවද තමා එය සෙනසුදාරා උදෑසන දැනගත් පසු කිසිඳු කලබලයකට ලක් නොවුණු අතර වෙනත් කණ්ඩායමක් ඊට කලින් දින මෙය දැන ගෙන ඇති නමුත් තමන් වැරැද්දක් නොකළ නිසා කලබලයට පත් නොවූ බවද තමන් අසාධාරණ වැඩ නොකළ අතර ඕන වෙලාවක එලියට බැස යාමට හැකියාවක් තිබූ බවද පවසන ලදී.

එමෙන්ම තමාට මෙන්ම ඇඹිලිපිටිය නගර සභාවේ සභාපතිතුමාටද මෙම දේ සිදු වූ බව තමන් දෙදෙනා දන්නේ පසුදින බවද ඊට දින 03 කට පසු බාහොම අසාධාරණ ලෙස චෝදනා පත්‍රයක් නිකුත් කළ අතර එම චෝදනා පත්‍රයේ සම්පූර්ණයෙන්ම තිබෙන්නේ සභාවේ සමූහිකව ගත් තීන්දු තීරණ සඳහා බවද එහි අසාධාරණය සිදු වූයේ බළන්ගොඩ ජනතාව බවද මෙම තනතුර තමන් බලෙන් ලබා ගත් එකක් නොවන නිසාත් තම හෘද සාක්ෂියට එකඟව තමන්ගේ රාජකාරිය අවංකවත් සද්භාවයෙන් සියලු දේ කර ඇති බවද පවසන ලදී.

තම බිරිඳ කොළඹ රාජකීය විද්‍යාලයේ ගුරුවරියක වශයෙන් සේවයකරන අතර තමන්ගේ දියණිය ලංකාවේ ප්‍රධානම කාන්තා විද්‍යාලයේ ඉගෙනුම ලබන බවද තම පුතා කොළඹ ප්‍රසිද්ධ පාසලක ඉගෙනුම ලබන බවද ඔවුන්ගේ මිතුරන්ගේ දෙමාපියන්ට යාලු මිත්‍රාදීන්ට මුහුණ දීමට හැකියාවක් නොමැති බවද දේශපාලන අධිකාරියේ මොන කුහකයෝ මොන ජරා මිනිස්සු මොන අසාධාරණ තීන්දුව දුන්නද තමාට සාධාරණයක් වන ස්ථානයක් මේ ලංකාවේ කොහේ හෝ ඇතියි විශ්වාස කළ බවද පවසන ලදී. ඒ අනුව තමන් ගරු අධිකරණය විශ්වාස කළ බවද අනතුරුව නෙවිල් කරුණාරත්න මහතාත් චමින්ද අතුකෝරළ නීතිඥතුමාත් එමෙන්ම උදෑසන තමන් මතක් කළ පරිදි දේශපාලන අධිකාරියේ පුද්ගලයෙන් උදව් උපකාර ඇතුව ඇඹිලිපිටිය නගර සභාවේ ගරු සභාපතිතුමා හා එක්ව සහයෝගයෙන් නඩු කටයුත්ත සිදු කළ බවද එහිදී තමාට වූ අසාධාරණය අධිකරණය හමුවේ පැවසූ බවද පවසන ලදී. ඒ අනුව ගරු අධිකරණය විසින් ගැසට් පත්‍රය අවලංගු කර නැවත වරක් බළන්ගොඩ නගර වැසියන්ට අවශ්‍ය කරන සේවය ලබා දීමට අවස්ථාව සලසා දුන් බවද ඒ පිළිබඳව තමන් නිහතමානිව සතුටු වන බවද පවසන ලදී. බළන්ගොඩ නගරයට නායකත්වය දෙමින් ගරු සභාවට නායකත්වය දෙමින් කටයුතු කිරීමට නැවත වතාවක් තමාට අවස්ථාව ලැබූ බවද නමුත් සභාවේ මන්ත්‍රී කණ්ඩායමේ අනවශ්‍ය හැසිරීම නිසා පුනරාවර්ථන වියදම් පමණක් දැරීමට හැකි අතර ප්‍රාග්ධන වියදම් දැරීමට හැකියාවක් නොමැති බවද එම කටයුතු අවසන් වීමට තම කොතරම් කාලයක් යාවි දැයි නොදන්නා බවද පවසන ලදී. එසේම මේ වන විට මෙය අවසන් වී තිබිය යුතු බවද කුමන ප්‍රශ්නයකදී වුවද අසාධාරණයක් සිදු වන්නේ නම් මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පළාත් පාලන පනත ආදී සම්මතයන්ට විරුද්ධව යන්නේ නම් ඕන කෙනෙකුට විරුද්ධව නඩු මාර්ගවලට ගොස් මුලු රටටම නීතියේ ඇති ආධිපත්‍යය ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති බලය පෙන්වා අවශ්‍ය කටයුතු කිරීමට තමා සූදානම් බවද ජනතාව වෙනුවෙන් මෙම කාලය තුළ අවශ්‍ය කරන සංවර්ධන කටයුතු කිරීමට අත්හිටුවා ඇති දැන්වීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තූතිය පලකරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.4.05ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.